පොල් සංවර්ධන අධිකාරිය



වාර්ෂික වාර්තාව

2020

අපගේ දර්ශනය

“පොල් කර්මාන්තය දළ දේශීය
නිෂ්පාදනය සඳහා
වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම
දායකත්වය ලබා දෙන්නා වීම සහ
නිෂ්පාදන අළෙවි විවිධාංගීකරණයේදී
ගෝලීය නායකයා වීම.”

අපගේ මෙහෙවර

ගෘහස්ථ පාරිභෝජනය සහ කර්මාන්තය සඳහා
පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම
තහවුරු කිරීම මඟින්,
පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය
ඵලදායීතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය
සඳහා ඉහළ දායකත්වයක් කරා
ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම.

හැඳින්වීම

සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතෙහි "පොල් සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය" යන 111 වන කොටසේ 24 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ප්‍රධානතම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ.

පොල් සංවර්ධන අධිකාරියේ කර්තව්‍යයන් පනතේ 30(1) වගන්තිය අනුව පහත පරිදි වේ.

(අ) පොල් කර්මාන්තය සහ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ආර්ථික වශයෙන් ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් සංවර්ධන ප්‍රමුඛතා පිළිබඳව තීරණය කිරීම හා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත සහය ලබා දීම.

(ආ) එසේ තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා වලට අනුකූලව ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සකස් කිරීම හෝ සකස් කිරීම සඳහා සහය වීම.

(ඇ) එසේ සකස් කරනු ලබන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා සහය ලබා දීම.

(ඈ) මෙම පනත යටතේ අමාත්‍යවරයා විසින් පිහිටුවා ඇති මණ්ඩලවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඉ) මණ්ඩලවල වාර්ෂික අයවැය අනුමත කිරීම හා ඔවුන් වෙත අරමුදල් ලබා දීම.

(ඊ) නිසි කළමනාකරණ ගිණුම්කරණ පද්ධති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා මණ්ඩල වෙත උපදෙස් ලබා දීම හා සහය ලබා දීම.

(උ) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මණ්ඩලවල ප්‍රගතිය ඇගයීම.

(ඌ) පොල් කර්මාන්තය හෝ එහි නිෂ්පාදන පිළිබඳ යම් අංශයක් හෝ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ සිදු කරනු ලබන යම් තැනැත්තෙකුට හෝ පුද්ගල මණ්ඩලයකට (සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ) මූල්‍ය සහ වෙනත් යම් ආකාරයක සහය ලබා දීම හා එවැනි පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

(එ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සමාන හිමිකම් හා කර්තව්‍යය ඉටු කරනු ලබන ජාත්‍යාන්තර සංවිධාන සමඟ සහයෝගීතාවන්ට එළඹීම.

(ඒ) පොල් කර්මාන්තය කෙරෙහි බලපාන හෝ අදාළ සියළු කාරණා පිළිබඳව අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම.

(ඔ) පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම හා යලි පණ ගැන්වීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියේ මතය වන සියළු පියවර ගැනීම.

අධිකාරියේ බලතල පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව පහත පරිදිවේ.

31 (1) අධිකාරියේ කර්තව්‍යය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උචිත හෝ අනුශාංගික වන්නා වූ යම් සියළු ක්‍රියා සිදු කිරීමට වහා පියවර ගැනීමට අධිකාරියට බලතල තිබිය යුතුය.

(2) (1) වන උප වගන්තිය මඟින් පවරා ඇති බලතල ව්‍යාප්තියට අගතියක් නොමැතිව 22 (2) වන වගන්තිය මඟින් විධිවිධාන සලස්වා ඇති සියළු බලතල මණ්ඩලය හා සමානව අධිකාරිය වෙත තිබිය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් යෝග්‍ය යැයි සලකනු ලබන විට ඔහු විසින් ගැසට් පත්‍රයේ කරනු ලබන නියමයක් මඟින් 23 වන වගන්තිය මඟින් විධි විධාන සලස්වා ඇති විශේෂ බලතල වලින් එකක් හෝ කිහිපයක් හෝ ඉන් යම් කොටසක් මණ්ඩලය හා සමාන ආකාරයෙන් අධිකාරිය වෙත පවරනු ලැබිය හැකිය.

පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වලින් දළ දේශීය නිෂ්පාදනයට වාර්ෂිකව විශාල දායකත්වයක් ලබා දේ. 2018 වසරට සාපේක්ෂව 2019 වසරේදී පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් මෙතෙක් වාර්තාගත ඉහළම අපනයන ආදායම වූ රු. බිලියන 109 ක් ලබාගැනීමට හැකිවූ අතර, එය 15% ක වර්ධනයකි.

අමාත්‍යාංශය විසින් පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන සකස් කිරීමේදී ඒ සඳහා සහය දැක්වීමේ කාර්යයන් ඉටු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ පිරිසැකසුම් සහ අලෙවිකරණ අංශයන් සංවර්ධනය කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී මෙහෙයුම් කාර්යභාරය ක්‍රියාත්මක කිරීම උදෙසා කාර්යයමය වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, මුදල් අංශය සහ පාලන අංශය යනුවෙන් ක්‍රියාකාරී අංශ 5 කින් සමන්විත වන අතර එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරයි. මෙම කාර්යයන් ඉටු කරගැනීමේදී ඉංජිනේරු අංශය සහ අභ්‍යන්තර විගණන අංශය ඉහත අංශවලට සහය වේ.

සභාපති ප්‍රධානියා වශයෙන් කටයුතු කරන අතර අධිකාරියේ වැඩකටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, පාලන අංශය හා මුදල් අංශයේ අධ්‍යක්ෂවරුන් හරහා ඉටු කරනු ලබයි. මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2020 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 199 වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් 31 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.

සභාපතිගේ සමාලෝචනය

පුරාතනයේ වෙරළ ආශ්‍රිත ප්‍රදේශ වල ව්‍යාපත්ව අනතුරුව ගොඩබිම අභ්‍යන්තරයට ව්‍යාප්ත වූ පොල් ගස මෙරට කප්රුක යන විරුදාවලිය ලබා ඇති අතර, ශ්‍රී ලාංකීය ජන සමාජයේ ආහාර රටාව සඳහා අත්‍යාවශ්‍ය බෝගයක් මෙන්ම සෘජු හා වක්‍ර ආදායම් මාර්ගයක් බවට පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත පත් වීම හේතුවෙන් මෙරට ප්‍රධානම ආර්ථික බෝග අතුරින් අද්විතීය ස්ථානයක් වර්තමානයේ දී හිමි කරගෙන ඇත.

ශ්‍රී ලංකාවේ පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත, ලෝකයේ වැඩිම පොල් නිෂ්පාදන රටවල් වන ඉන්දුනීසියාව පිළිපීනය හා බ්‍රසීලයට පමණක් පිටුපසින් සිටින අතර ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් ඵලදාව ගෙඩි මිලියන 3000 ක් පමණ වේ. මුළු පොල් නිෂ්පාදනයෙන් ගෙඩි මිලියන 1800ක් පමණ ගෘහාශ්‍රිත පාරිභෝජනයට ද ඉතිරිය පොල් මද ආශ්‍රිත කර්මාන්ත වන දිසිඳි පොල්, පොල් කිරි, පොල් තෙල්, පොල් කිරිපිටි, පොල්ක්‍රීම් කොප්පරා හා ගෙඩි පොල් වශයෙන් ද පොල් කර්මාන්තයට යොදා ගනී. එමෙන්ම පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදන කර්මාන්ත වන සක්‍රීය කාබන්, පොල් කොහු, කොහුබත් සහ පොල් ලෙලි ආශ්‍රිත කර්මාන්ත සඳහා ද ජාත්‍යන්තර වෙළඳපොල තුළ විශාල ඉල්ලුමක් ලැබෙමින් පවතී.

වර්තමානයේදී ජාත්‍යන්තර වෙළඳපොල තුළ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවත්නා අතර අපනයනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් පවත්වාගෙන යාම සඳහාත්, එතුළින් ජාත්‍යන්තර වෙළඳපොල තුළ ශ්‍රී ලාංකීය පොල් ආශ්‍රිත නිෂ්පාදන කෙරෙහි ඉහළ ඉල්ලුම තව දුරටත් වර්ධනය කරවීම සඳහාත් පොල් සංවර්ධන අධිකාරිය මඟින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මූල්‍ය දායකත්වය, උපදේශනය සහ නියාමනය ආදී සෑම කර්තව්‍යයක් මඟින් ඉතා ඉහළ මට්ටමක කාර්යයභාරයක් ඉටු කිරීම ඉමහත් සතුටට කරුණකි.

2019 වර්ෂයේ ඉහළම අපනයන ආදායම ලෙස වාර්තා වූ රුපියල් බිලියන 109 ක් වූ ආදායම, 2020 වර්ෂය තුළ රුපියල් බිලියන 123 දක්වා වර්ධනය කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර, 2020 වසර තුළ ඇතිවූ COVID-19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ වුවද අපනයන ආදායම 12%කින් සමස්ථ ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ අපනයන ආදායම පුරෝකථනයන් අභිබවා වැඩිකර ගැනීමට හැකිවූ අතර එය මෙතෙක් වාර්තාගත වැඩිම අපනයන ආදායම වේ.

ශ්‍රී ලාංකීය ජනතාව තුළ නිවැරදි ආහාර සැකසුම් රටාවන් තුළින් ලංකාවේ ගෘහාශ්‍රිත පොල් නාස්තිය අවම කර පොල් මද ආශ්‍රිත කර්මාන්ත වැඩි දියුණු කිරීමට දායකත්වය සහ නියාමනයෙන් දායක වීමටත් පොල් මද ආශ්‍රිත නොවන කර්මාන්ත නිවැරදි සහ කාර්යක්ෂම ක්‍රමවේදයක් හරහා එක් රැස් කර පරිසර හිතකාමී ක්‍රමවේද හරහා නිෂ්පාදන ක්‍රියාවලියට යෙදවීම තුළින් එම කර්මාන්ත නගා සිටුවීමටත් දැනටමත් පොල් සංවර්ධන අධිකාරිය පියවර ගෙන තිබේ. ශ්‍රී ලාංකීය ජනතාව වෙනුවෙන් පිරිසිදු හා ගුණාත්මක පොල් තෙල් හඳුනා ගැනීමට හැකි වන පරිදි තත්ත්ව සහතිකය මුද්‍රිත ලේබල් ක්‍රමය හඳුන්වා දීම, ගුණාත්මක නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රමිතියෙන් යුතු යන්ත්‍රෝපකරණ භාවිතය වැඩි කිරීමට දායක වීම, නිෂ්පාදන පරීක්ෂාව සඳහා රසායනාගාර සේවාවන් ලබා දෙමින් තත්ත්ව සහතික නිකුත්කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගුණාත්මකභාවයෙන් යුත් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය බැංකු සමඟ ඒකාබද්ධ වෙමින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ණය පහසුකම් ලබා දීම ඇතුළු ඉමහත් කාර්යයභාරයක් පොල් කර්මාන්තය නඟා සිටුවීම සඳහා ඉටු කරමින්, ශ්‍රී ලාංකීය පොල් කර්මාන්තය ජාත්‍යන්තර තලයට ඔසවා තැබීම අපගේ අභිප්‍රාය වේ.

.....

ජයන්ත වික්‍රමසිංහ

සභාපති

අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

පොදු ජන වහරේ "කප්රුක" ලෙස ව්‍යවහාර වන පොල් ගස ඇසුරින් පොල් මද ආශ්‍රිත නිෂ්පාදන , පොල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන, පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන හා වෙනත් විසිතුරු භාණ්ඩ හා දැවමය නිෂ්පාදන යන ශීර්ෂ යටතේ විවිධාංගීකරණය වූ අගයදාම ක්‍රියාවලියක් සහිත නිෂ්පාදන රාශියක් සිදු කරනු ලබයි. පොල් මද ආශ්‍රිත දිසිඳි පොල්, නැවුම් පොල් තෙල්, පොල්කිරි හා ක්‍රීම් නිෂ්පාදන සම්බන්ධ කර්මාන්තශාලා ISO තත්ත්ව සහතික මෙන්ම GMP තත්ත්ව සහතික ලද ජාත්‍යන්තර වෙළඳපළ වෙත ගුණාත්මක නිෂ්පාදන ඉදිරිපත් කරමින් ශ්‍රී ලාංකිය පොල් සන්නාමය ප්‍රචලිත කිරීමට දායකව ඇත. මේ සඳහා පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය මට්ටමේ පරීක්ෂකවරුන්ගේ මැදිහත්වීම හා මඟ පෙන්වීම මෙන්ම මෝල් සංවර්ධන අරමුදල මඟින් ලබා දෙන මූල්‍ය සහාය අධිකාරියේ රසායනාගාර හා තත්ත්ව පාලන සේවාවන්හි දායකත්වය ඉවහල්ව ඇත. කෙඳි ආශ්‍රිත නිෂ්පාදන විෂයෙහි තව දුරටත් වැඩි දියුණු කිරීම් අවශ්‍යතාවය හඳුනා ගනිමින් කොහු බත් හා උපස්ථර ආශ්‍රිත නියැඳී පරීක්ෂණ පුළුල් කිරීම, වියළුම් පිටි සඳහා මූල්‍ය හා තාක්ෂණික ආධාර සැපයීම මඟින් ලෝක වෙළඳපළ තුල පවත්නා ඉල්ලුමට සරිලන ඉහළ තත්ත්වයෙන් යුතු නිෂ්පාදන ඉදිරිපත් කිරීම මඟින් ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවේශය පුළුල් කිරීමට මඟ පෙන්වීම් අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

ග්‍රාමීය ප්‍රදේශ වල පොල් ආශ්‍රිත කර්මාන්ත වල නියැලෙන හා ඊට කැමැත්ත දක්වන්නන් සඳහා නොවිදිමත් ව්‍යාපෘති අංශ යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, ව්‍යවසායකයන් හඳුන්වා දීම හා වෙළඳපළ සම්බන්ධීකරණය මඟින් දිළිඳු කම පිටුදැකීම සඳහා කැපී පෙනෙන දායකත්වයක් අධිකාරිය මඟින් සපයනු ලබයි. 2020 වර්ෂයේ ලොව පුරා ජන ජීවිත අඩාල කරමින් පැතිරගිය COVID-19 වසංගතය ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍ර කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති අතර පොල් ආශ්‍රිත කර්මාන්ත එම අභියෝගයන් මධ්‍යයේ වුවද ඩොලර් මිලියන 661 ක ආදායමක් උපයා ඇත්තේ 2019 වර්ෂයට සාපේක්ෂව 8% ක වර්ධනයක් පෙන්නුම් කරමිනි.

ක්ෂේත්‍රයේ පවත්නා අභියෝග අතර ඉල්ලුමට සරිලන ගෙඩිපොල් නිෂ්පාදනයක් වාර්ෂිකව නොලැබීම කැපී පෙනේ. වසරේ පොල් හිඟ කාර්තුවේදී මෙම තත්ත්වය උග්‍ර අතට හැරෙන අතර විදේශ වෙළඳපළ මත පුළුල්ව රඳා පවතින පොල් කර්මාන්තයේ විදේශ ගැණුම්කරුවන් ආරක්ෂා කර ගැනීම මෙන්ම දේශීය පාරිභෝජනයට අවශ්‍ය පොල් දැරිය හැකි මිළකට පාරිභෝගිකයාට සැපයීම අභියෝගයකි. ක්ෂේත්‍රයේ නිරත සහෝදර රාජ්‍ය ආයතන වන පොල් වගා කිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන අධි ඵලදායී පොල් වර්ග හඳුනා දීම, ජල සම්පාදන ක්‍රම සඳහා සහන ලබා දීම , නව වගාවන් ව්‍යාප්ත කිරීම, පොහොර භාවිතය ප්‍රචලිත කිරීම වැනි යෝජනා ක්‍රියාත්මක කිරීම ඔස්සේ ගෙඩි පොල් ඵලදාව ප්‍රශස්ත මට්ටමට ගෙන ඒමට ඒකාබද්ධ ප්‍රවේශයකින් කැප වෙමින් පවතී. ගෘහස්ත නාස්තිය අවම මට්ටමක පවත්වා ගැනීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන , පොල් ලෙලි , පොල් කටු එකතු කිරීම කර්මාන්තයට අවශ්‍ය අමු ද්‍රව්‍ය සැපයුම් පුළුල් කිරීම සඳහා ජනතාව වෙත සන්නිවේදනය කිරීමටද අධිකාරිය සැලසුම් කර ඇත. මේ අනුව කර්මාන්තකරුවන් , වගා කරුවන්, අපනයන ක්ෂේත්‍රයේ නිරතවුවන් හා සම්බන්ධ සියළු රාජ්‍ය ආයතනයන්හී අන්‍යෝන්‍යය සබඳතාව තුළින් මනා සැලසුමකින් යුක්ත ප්‍රවේශයකින් ශ්‍රී ලාංකික පොල් සන්නාමය ලෝක වෙළඳපොළ ප්‍රචලිත කරමින් "කප්රුක" විදේශ විනිමය ලඟා කර දෙන ධන උල්පතක් කර ගත හැක.

.....

එම්.එල් දශිත නිරෝෂන

අධ්‍යක්ෂ ජනරාල්

2020 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්

1. ජයන්ත වික්‍රමසිංහ මහතා - සභාපති
2. එන්.එස්. වනසිංහ මහතා
3. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මහත්මිය
4. දිනේෂ් ප්‍රනාන්දු මහතා
5. ප්‍රියලත් කීඹියහෙට්ටිගේ මහතා
6. ජගත් චන්දන තල්ගස්දූව මහතා
7. උපාලි දම්මික ද සිල්වා මහතා

සභාපති ඇතුළු අංශ ප්‍රධානීන්

1 ජයන්ත වික්‍රමසිංහ මහතා	- සභාපති
2. සුරේකා එන් අත්තනායක මහත්මිය	- අධ්‍යක්ෂ ජනරාල්(වැ.බ) 2020.03.01 දින සිට 2020.11.30 දක්වා
එම්.එල් දශිත නිරෝෂ මහතා	- අධ්‍යක්ෂ ජනරාල් 2020.12.01 දින සිට
3. එස්. එස්. පුරසිංහ මහත්මිය	- අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ)
4. එම්. පී. සන්ධ්‍යා කාන්ති මහත්මිය	- අධ්‍යක්ෂ (මුදල්)
5. පී. ඒ. එස්. කේ. සම්පත් සමරවික්‍රම මහතා	- අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ)
6. පී. එදිරිමාන්න මහතා	- අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) රා.ආ.
7. එස්.ඩබ් රසිකා මහත්මිය	- අධ්‍යක්ෂ (පරිපාලන) රා.ආ.
8. ඩබ්. එම්. ටී. එස්. වීරසූරිය මහතා	- අභ්‍යන්තර විගණක

2020.12.31 දිනට සංවිධාන ව්‍යුහය



කෙටි යෙදුම් :

1. ජ්‍යෙෂ්ඨ කළ. - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටම
2. ස/නිඅධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
3. කළ. මට්. - කළමණාකරණ මට්ටම
5. පරි. නිලධාරී - පරිපාලන නිලධාරී
6. ආර්. පර්. නිලධාරී- ආර්ථික පර්යේෂණ නිලධාරී
7. සැ. සං. නිලධාරී - සැකසුම් සංවර්ධන නිලධාරී
9. කණි.කළ - කණිෂ්ඨ කළමණාකරණ මට්ටම
10. අලෙ. සං. හා. පර්. - අලෙවි සංවර්ධන හා පර්යේෂණ
11. තත්. පා. හා ආර. තත්ත්ව පාලන හා ආරක්ෂණ

පටුන

පරිච්ඡේද අංක

සැකසුම් සංවර්ධන අංශය	01
තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය	02
අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය	03
පරිපාලන අංශය	04
මුදල් අංශය	05
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	06
විගණකාධිපති වාර්තාව	07

01. සැකසුම් සංවර්ධන අංශය

සැකසුම් සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ පොල් ආශ්‍රිත කර්මාන්ත නියාමනය කිරීම හා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනයයි. ඒ යටතේ 2020 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැකසුම් සංවර්ධන අංශය සැලසුම් සකස් කරන ලදී.

1. නිෂ්පාදන ආයතන වල පිරි සැකසුම් ක්‍රියාවලි අධීක්ෂණය හා නිරන්තර නියැඳි පරීක්ෂාවන් මඟින් දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිති පිරිවිතර හා ගැළපෙන ලෙස සකස් කල නිෂ්පාදන අපනයනය සඳහා ඉදිරිපත් කිරීමට සහය වීම.
2. දිසිඳි පොල් කර්මාන්තයේ සංවර්ධන කටයුතු හෝ නිෂ්පාදනයේ නොයෙදෙන කාල වලදී සේවක චේතන ගෙවීම සඳහා මෝල් සංවර්ධන අරමුදල හරහා දායකත්වය ලබා දීම.
3. තත්ත්වයෙන් උසස් පොල් තෙල් නිෂ්පාදනය සඳහා කර්මාන්තකරුවන් යොමු කරවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා කාරක හා ප්‍රාග්ධන පහසුකම් සලසා දීම මඟින් නිෂ්පාදන කාර්යක්ෂමතාව, සඵලත්වය ඉහල නංවාලීම හා ඒකක පිරිවැය අවම කිරීම.
5. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය බැංකු ණය පහසුකම් ලබා ගැනීම සඳහා මඟ පෙන්වීම හා පොළී සහන ලබා දීම.
6. පොල් ආශ්‍රිත නිෂ්පාදකයින් සඳහා ඇති නව ප්‍රවණතා, තාක්ෂණය හා පර්යේෂණ සඳහා ප්‍රේරණය ඇති කිරීම හා නිපුණතා වර්ධනය සඳහා දේශීය හා විදේශීය තාක්ෂණය වෙත කර්මාන්තකරුවන් යොමු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නිලධාරීන් පුහුණු කිරීම.
7. අවිධිමත් කර්මාන්තය නගා සිටුවීම සඳහා දායකත්වය ලබා දීම.

මෙම සැලසුම්කරණයෙන් පොල් සංවර්ධන අධිකාරියේ මෙහෙවර හා දැක්ම පදනම් කර ගනිමින්, තිරසාර සංවර්ධනය ඉලක්ක කර ගනිමින් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ඉලක්කගත අපනයන ආදායම් වර්ධනය කර ගැනීම මූලික වශයෙන් අපේක්ෂා කරන ලදී.

ඒ අනුව, 2020 වර්ෂයේ ඉහත සඳහන් කල සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා සැකසුම් සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් හා වැඩසටහන් පහත පරිදි වේ.

1. පොල් ආශ්‍රිත කර්මාන්ත, නිෂ්පාදකයෙකු ලෙස ලියාපදිංචි කිරීම තුළින් පවත්නා නීති හා රෙගුලාසි අනුව කර්මාන්තය පවත්වා ගැනීමට යොමු කරවීම හා නියාමනය කිරීම.
2. පොල් නිෂ්පාදන ආයතන පරීක්ෂා කිරීම, ආදර්ශ ලබා ගැනීම හා විශ්ලේෂණයට යොමු කරවීමත් ඒ මඟින් ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නිෂ්පාදන නිපදවීමට කර්මාන්තකරුවන් යොමු කරවීම. ඒ සඳහා අදාළ පරිදි උපදෙස් ලබා දීම.
3. ක්ෂුද්‍රජීවී සහ භෞතික තත්ත්ව සහතික නිකුත් කිරීම තුළින් පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමිති පිරිවිතර පවත්වා ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම.
4. පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO 22000 ආහාර සුරක්ෂිතාව පිළිබඳ තත්ත්ව සහතික ක්‍රමවේදය සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) තත්ත්ව පද්ධති යන අන්තර්ජාතික තත්ත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම එම නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමට දායක වීම.
5. දිසිඳි පොල් නිෂ්පාදන ආයතන මෝල් සංවර්ධන අරමුදල යටතේ නවීකරණ, සංවර්ධන කටයුතු හා නිෂ්පාදන සිදු නොවන අවස්ථා වලදී සේවක චේතන ගෙවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.
6. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව සහන පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා පොළී ප්‍රතිදාන ලබා දීම තුළින් කර්මාන්ත සංවර්ධනය කිරීම.

7. ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් නිෂ්පාදනය හා ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් පාරිභෝගිකයින් වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රමවේද සකස් කිරීම හා ඊට කර්මාන්තකරුවන් යොමුකිරීම.
8. පොල් කොහු කෙඳි නිෂ්පාදනායතන වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන සහය ලබා දීම.
9. නිලධාරීන්ගේ කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවා නියුක්තිය සඳහා නිපුණතා සංවර්ධනය කිරීම.
10. සැකසුම් සංවර්ධන අංශයේ පරීක්ෂණ ඒකකය වෙත පරීක්ෂා කිරීම් සඳහා වූ ISO 17020:2012 ප්‍රතීතන/ අනුකූලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කිරීම.
11. අවිධිමත් කර්මාන්ත සඳහා අගය වැඩි කල නිෂ්පාදන හඳුන්වාදීම සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, උපකරණ ලබා දීම.
12. පරිසර හිතකාමී පොල්කටු දහන උඳුන් ඉදි කිරීම සඳහා අවිධිමත් අංශයේ කර්මාන්තකරුවන් වෙත ආයෝජන සහය ලබා දීම.

1. පොල් ආශ්‍රිත කර්මාන්ත, නිෂ්පාදකයෙකු ලෙස ලියාපදිංචි කිරීම තුළින් පවත්නා නීති හා රෙගුලාසි අනුව කර්මාන්තය පවත්වා ගැනීමට යොමු කරවීම හා නියාමනය කිරීම.

2019 නොවැම්බර් මස සිට, 2020 වර්ෂය සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදකයන් හා සැකසුම්කරුවන් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී. අදාළ ලියාපදිංචි අයඳුම්පත් පොල් සංවර්ධන අධිකාරියේ කොළඹ 01, ආදිපාද වීදියේ කොටුව කාර්යාලයෙන් හා කුරුණෑගල, ගම්පහ,පුත්තලම, ගාල්ල, රත්නපුර හා මාතර යන ප්‍රාදේශීය කාර්යාල වලින්ද නිකුත් කරන ලදී. තවද අදාළ ලියාපදිංචි අයදුම්පත් පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙන් ලබා ගැනීමටත් මාර්ගගත(online) ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය ඉල්ලුම් කිරීමටත් කර්මාන්තකරුවන්ට අවස්ථා සලසා දෙන ලදී. ඒ අනුව ලියාපදිංචි කරන ලද කර්මාන්ත පිලිබඳ විස්තරය පහත වගුවෙහි සඳහන් වේ.

		ලියාපදිංචි ගණන		
	නිෂ්පාදන වර්ගය	**2018**	**2019**	**2020**
1	දිසිඳි පොල්	46	48	46
2	පොල් කිරම	15	17	14
3	පිටිකල පොල් කිරි	9	12	13
4	කොප්පරා පොල් තෙල්	69	89	101
5	නැවුම් පොල් තෙල්	58	60	50
6	සුදු පොල් තෙල්	31	38	39
7	MCT තෙල්	_	_	1
8	MCT පවුඩර්	_	_	2
9	කාර්මික පොල් තෙල්	6	7	9
10	පොල් වතුර	22	22	23
11	පොල් විනාකිරි	1	1	1
12	කුරුටු පොල් තෙල්	23	34	35
13	පොල් කිරි	21	22	24
14	පිටිකළ පොල්කිරි	4	6	6
15	පොල්කිරි ආශ්‍රිත නිෂ්පාදන	4	5	5
16	පොල් බටර්	3	7	8
17	පොල් සීනි	3	4	1
18	පිරිපහදු කරන ලද පොල්තෙල්	7	7	8
19	මෘදු කාරක ජෙල්	1	1	1
20	කොප්පරා	35	26	26
21	පොල් තැවරුම	4	3	5
22	දිසිඳි පොල් නැවත ඇසුරුම	2	1	3

23	පොල් සිරප්	5	3	3
24	ගාන ලද පොල්	2	1	1
25	පොල් පැණි	2	7	10
26	පොල්කිරි සැකසුම්කරු	2	2	2
27	පොල් ඇමිනෝ	_	_	3
28	පොල් ජෑම්	1	1	1
29	පොල් පිටි	_	_	5
30	සක්‍රීය කාබන්	9	7	10
31	කොහු /කොහු මෝල්	342	267	283
32	පොල්කටු අඟුරු කැට	5	5	5
33	Hub ක්‍රියාකරු	1	1	1
34	පොල්කටු අඟුරු	17	33	33
35	පොල්කටු කැබලි / පව්ඩර්	3	1	3
36	පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ	6	8	11
37	නිමි භාණ්ඩ	133	126	137
38	කොහුබත් උපස්තර	117	120	124
39	කෙඳි අතරමැදි නිපැයුම්	31	39	37
	වෙනත්	0	15	2
	එකතුව	**1040**	**1046**	**1092**

වගුව 01: 2018 සිට 2020 වර්ෂය දක්වා පොල් ආශ්‍රිත නිෂ්පාදකයින්/ සැකසුම්කරුවන්ගේ ලියාපදිංචිය

2019 වර්ෂයේ දී මෙන්ම 2020 වසරේ දී ද අධිකාරිය හා ලියාපදිංචි පොල් ආශ්‍රිත කර්මාන්ත පිළිබඳව සලකා බලන විට පොල් තෙල්, කොහු බත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ලියාපදිංචියේ සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. පෙර වසර වලදී මෙන්ම 2020 වසරේද විශේෂයෙන් පොල්තෙල් හා කොහු කර්මාන්ත සංවර්ධනය සඳහා අධිකාරියෙන් දක්වන වන ලද අඛණ්ඩ අනුග්‍රහය හා ව්‍යාපෘති සේවා පුළුල් වීම මෙම ලියාපදිංචිය වැඩි වීමට හේතු වන ලදී.



ප්‍රස්ථාරය 01: දිස්ත්‍රික්ක අනුව ලියාපදිංචි පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත වල ව්‍යාප්තිය

ඒ අනුව පොල් ත්‍රිකෝණයේ ලියාපදිංචි කර්මාන්ත ව්‍යාප්තිය 74% කි. ඉතිරි දිස්ත්‍රික්ක සියල්ලේම ලියාපදිංචිය 26% කි.

2. පොල් නිෂ්පාදන ආයතන පරීක්ෂා කිරීම, ආදර්ශ ලබා ගැනීම හා විශ්ලේෂණයට යොමු කරවීමත් ඒ මඟින් ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නිෂ්පාදන නිපදවීමට කර්මාන්තකරුවන් යොමු කරවීම.

2.1 කොහුකෙඳි හා කොහු බත් උපස්ථර ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

කොහු කෙඳි නිෂ්පාදකයන් ස්වකීය ආයතනයේ නිෂ්පාදනය වන කොහු කෙඳි හා කොහු බත්වල ප්‍රමිතියානුකූල තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම සඳහාත් පිරිවිතරෙන් අපගමනයවන අවස්ථාවන් නිරීක්ෂණය කර නිෂ්පාදන ක්‍රියාවලිය සකසා ගැනීම සඳහාත් කොහු කෙඳි හා කොහු බත් ආදර්ශ විශ්ලේෂණය කිරීම අරමුණු විය.

මෙහිදී කොහුබත් උපස්ථර නියැඳි වල pH අගය, තෙතමනය (Moisture), විද්‍යුත් සන්නායකතාවය (Electrical conductivity), බාහිර අපද්‍රව්‍ය (Extraneous matter), ඊ කෝලි (Ecoli), හා සැල්මොනෙල්ලා (Salmonella) යන පරාමිතීන්ද, කොහු නියැඳි වල තෙතමනය (Moisture) හා අපද්‍රව්‍ය (Impurities) යන පරාමිතීන් විශ්ලේෂණය කරන ලදී.

ඒ අනුව 2020 වසර සඳහා ද අධිකාරියේ ලියාපදිංචි කොහුබත් උපස්ථර නිෂ්පාදන ආයතන වලින් නිෂ්පාදන 239ක ආදර්ශ රැස් කර තත්ත්ව සහතික නිකුත් කර ඇත. තවද තෝරාගත් කොහු කෙඳි නිෂ්පාදන ආයතන 130 කින් ආදර්ශ රැස් කර තත්ත්ව සහතික නිකුත් කිරීමට කටයුතු කර ඇත.

ඒ ඒ ආයතන වල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිතියන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යයනය කර නිවැරදි කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලදී.

2.2 නැවුම් පොල් තෙල් ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

විශ්ලේෂණ වාර්තා අනුව, නිෂ්පාදන වල ප්‍රමිතිය නැවුම් පොල්තෙල් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සැසඳීම් හා නොගැළපෙන අවස්ථාවන්හිදී එම දත්තයන් වල නිරවද්‍යතාවය සඳහා පියවර ගැනීම මෙම විශ්ලේෂණ ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය වේ.

නැවුම් පොල් තෙල් ආදර්ශ, අධිකාරියේ රසායනාගාරය මඟින් නිදහස් මේද අම්ල (Free fatty acids), පැහැය (Colour) , තෙතමනය (Moisture), අයඩින් අගය (Iodine value) සහ දිලීර හා පුස් (Yeast & Moulds) යන විශ්ලේෂණ පරාමිති යටතේ විශ්ලේෂණය කරන ලදී.

2020 වසරේදී නැවුම් පොල් තෙල් ආදර්ශ 23ක විශ්ලේෂණයන් සිදුකර ඇත.

2.3 පොල් කිරි නිෂ්පාදන ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

2020 වර්ෂය සඳහා පොල් කිරි කර්මාන්තායතන 24 ක් හා පිටිකළ පොල් කිරි නිෂ්පාදන 07ක් ලියාපදිංචි වී ඇත. සකස් කරන ලද පොල් කිරි ස්වාභාවික පොල් කිරි මෙන් ගුණාත්මක රසයෙන් හා පෝෂණීය ගුණයෙන් යුතු වන්නේ දැයි විපරම් කිරීම සඳහා වෙළඳපොළේ පවත්නා පොල් කිරි සහ පිටි කල පොල් කිරි ආදර්ශ පරීක්ෂා කිරීමට ලක් කරන ලදී. මෙහිදී පොල් කිරි ආදර්ශ වල මේදය ප්‍රමාණය හා pH අගය පරීක්ෂා කරන ලද අතර පිටිකළ පොල්කිරි ආදර්ශ වල Salmonella, Ecoli, pH අගය, මේදය ප්‍රමාණය පරීක්ෂා කරන ලදී. කර්මාන්තායතන වලින් පොල් කිරි ආදර්ශ 123ක් සහ පිටිකළ පොල් කිරි ආදර්ශ 21ක් පරීක්ෂා කර විශ්ලේෂිත වාර්තා ලබා ගන්නා ලදී.

පොල් කිරි සහ පිටිකළ පොල් කිරි නිෂ්පාදනයේදී ලබා ගන්නා අතුරුඵලයක් වන පොල් කුරුටු කාර්යක්ෂමව සහ සඵලදායිව පොල් තෙල් කර්මාන්තයට යොදා ගෙන ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව කුරුටු පොල් තෙල් නිෂ්පාදනය සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් සිදු කරන ලදී.

2.4 පොල්තෙල් ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

සැකසුම් සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ගුණාත්මක පොල්තෙල් නිෂ්පාදන සඳහා ලාංඡනයක් ලබාදීමේ වැඩසටන යටතේ , පොල්තෙල් කර්මාන්තායතන වලින් පොල්තෙල් නියැඳි 107ක ආදර්ශ ලබාගෙන එම වැඩසටහනේ මූලික කරුණු සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ SLS 32: 2017 ට අනුරූපව පොල් තෙල් වල අයඩින් අගයත්, නිදහස් මේද අම්ල ප්‍රමාණයත්, ඇෆ්ලටෝක්සීන් අගයත් නියැඳි පරීක්ෂාවට භාජනය කරමින් විශ්ලේෂණ වාර්තා ලබා ගන්නා ලදී.

ඒ ඒ ආයතන වල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිතියන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යයනය කර නිවැරදි කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලද අතර විශ්ලේෂිත තොරතුරු පදනම් කර ගනිමින් අදාළ වැඩසටහනේ ඉදිරි කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

2.5 පොල් කටු අඟුරු විශ්ලේෂණ ක්‍රියාවලිය

2020 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ අපනයන අදායම් ඉහල නැංවීමට දායක වන තවත් පොල් හා සම්බන්ධ ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගත් සක්‍රීය අඟුරු නිෂ්පාදනයේ මූලික අමුද්‍රව්‍ය වන පොල්කටු අඟුරු විශ්ලේෂණය කිරීම ආරම්භ කරන ලදී. මෙහිදී තෙතමනය, අළු ප්‍රමාණය හා බාහිර අපද්‍රව්‍ය යන පරාමිතීන් විශ්ලේෂණය කරන ලදී. ආරම්භයක් ලෙස නිෂ්පාදන ආයතන 09කින් නියැදි ලබාගෙන විශ්ලේෂණ කටයුතු සඳහා යොමු කරන ලදී.

ඒ ඒ ආයතන වල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිතියන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යනය කර නිවැරදි කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලදී.

3. ක්ෂුද්‍ර ජීවී සහ භෞතික තත්ත්ව සහතික නිකුත් කිරීම තුළින් පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම.

සැකසුම් සංවර්ධන අංශයේ සේවා සමායෝජන ඒකකය මඟින් සපයනු ලබන ඉහත සඳහන් සේවාව තුළින්, අපනයනකරුවන් වෙත තම නිෂ්පාදන අපනයනයේදී නිෂ්කාශන කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කරගැනීමට මෙම සහතිකපත් ලබා දීම සිදුකෙරේ. මෙම තත්ත්ව සහතික නිකුත් කිරීම නිෂ්පාදන වල විශ්ලේෂණ පිරිවිතර හා ඍජුව සම්බන්ධ වන බැවින් තත්ත්වයෙන් උසස් නිෂ්පාදන සිදු කිරීමට ඔවුන් නිතැතින්ම පෙළඹේ.

2020 වර්ෂය තුල දිසිඳි පොල් මෙට්‍රික් ටොන් **25,255.15** නිෂ්පාදන කර ඇති අතර, ඉන් ක්ෂුද්‍ර ජීවී සහ භෞතික පරාමිති විශ්ලේෂණය කිරීම සඳහා දෛනික දිසිඳි ආදර්ශ 6006 ක් සැකසුම් සවර්ධන අංශය වෙත ලැබී ඇත. ඒ මත පදනම්ව අපනයන සහතික 572ක් නිකුත් කර ඇත.

සහතික වර්ගය	**නිකුත් කල සහතිකපත් ගණන**	
	2019	**2020**
සැල්මොනෙල්ලා රහිත බවට	384	197
භෞතික තත්ත්ව විශ්ලේෂණ	384	197
ඇෆ්ලටෝක්සින් රහිත බවට	127	83
සල්ෆර් ඩයොක්සයිඩ් රහිත බවට	148	95
මුළු ගණන	**1043**	**572**

වගුව 02: දිසිඳී පොල් අපනයන තොග සඳහා ක්ෂුද්‍ර ජීවී හා භෞතික තත්ත්ව විශ්ලේෂණ සහතික පත් නිකුත් කිරීම

2020 වර්ෂයේ නිකුත් කරන ලද සහතිකපත් ප්‍රමාණය 2019 වර්ෂයට සාපේක්ෂව 50% ක පමණ පහල බැසීමකි. මේ සඳහා බලපාන ලද ප්‍රධානම කාරණය වන ලද්දේ 2020 වර්ෂයේ ශ්‍රී ලංකාව ඇතුළු සියළුම රටවලට බලපෑ කොවිඩ් වසංගත තත්ත්වය හා පොල් අස්වැන්නේ සිදුවන ලද අනපේක්ෂිත අඩු වීමයි.

අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් විසින් අවශ්‍යතා මත ගෙනවිත් භාරදෙන පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශ විශ්ලේෂණ කටයුතු සඳහා රසායනාගාරය වෙත යොමු කිරීමෙන් අනතුරුව ලද ප්‍රතිඵල ලේඛණ අනුව පහත පරිදි විශ්ලේෂණ වාර්තා සහතික නිකුත් කර ඇත.

නිෂ්පාදන වර්ගය	නිකුත් කල වාර්තා ගණන		
	2020	**2019**	**2018**
කොහු/ කොහුබත්	250	316	255
පොල්තෙල්	319	211	341
දිසිඳි පොල්	08	18	13
මේදය තරමක් ඉවත් කල දිසිඳි පොල්	51	87	144
පොල් කිරි	03	9	3
පුන්නක්කු	03	-	-
පොල් ක්‍රීම්	02	-	-

වගුව 03: කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම අනුව ලැබෙන ආදර්ශ සඳහා ප්‍රතිඵල වාර්තා නිකුත් කිරීම

4. පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO 22000 ආහාර සුරක්ෂිතතාව පිළිබඳ තත්ත්ව සහතික ක්‍රමවේදය සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) තත්ත්ව පද්ධති යන අන්තර් ජාතික තත්ත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම එම නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමට දායක වීම.

ISO 22000:2018 යනු ආහාරයක් ලෙස පාරිභෝජනය සඳහා සුරක්ෂිත වන බවට තහවුරු කරනු ලබන තත්ත්ව සහතිකකරණ පද්ධතියකි. පොල් මද හා පොල් චතුර ආශ්‍රිතව නිෂ්පාදන කරනු ලබන ආහාරමය නිෂ්පාදන සඳහා මෙම තත්ත්ව සහතිකය ලබා ගැනීම අනිවාර්ය කර ඇත. අන්තර්ජාතික ප්‍රමිතීන් සහිත කාර්යක්ෂම ,නිරසාර පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් උසස් තත්ත්වයේ නිෂ්පාදනයක් ඇති කිරීම මෙහි මූලික අරමුණ විය. මෙමඟින් ගුණාත්මක සහ ප්‍රමිතියෙන් උසස් නිෂ්පාදනයක් වෙළඳපලට නිකුත් කිරීම සිදු වන අතර එමඟින් කර්මාන්තකරුට වෙළඳපොල තුල සුවිශේෂී ස්ථානයක් ගොඩනගා ගත හැකි වනු ඇත.

මෙහිදී SLAB හා IFA යන ආයතනවල ප්‍රතීතනය වූ සහතිකකරණ ආයතන විගණන කටයුතු පවත්වන විට විගණනය සඳහා පුහුණුවලත් ක්ෂේත්‍ර නිලධාරියෙකු ඒ සඳහා යොමු කරන අතර එම නිලධාරියා විසින් ලබාදෙන නිරීක්ෂණ වාර්තාවට අනුව අදාල ආයතනයන්හි පවතින දුර්වලතා නිවැරදි කිරීමට කටයුතු කිරීම සඳහා යොමු කරන ලදී. 2020 වර්ෂය අවසාන වන විට කර්මාන්ත 62 ක ISO 22000:2018 විගණන පරීක්ෂණ සඳහා සහභාගී විය.

GMP යනු මනා නිෂ්පාදන ක්‍රියාවලියක් පවත්වාගෙන යන බව තහවුරු කරනු ලබන තත්ත්ව පද්ධතියකි. මෙම තත්ත්ව සහතිකය කොහු ආශ්‍රිත නිෂ්පාදන හා කොහු බත් නිෂ්පාදන ලියාපදිංචියෙදී අනිවාර්ය කර ඇත . මෙම තත්ත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල තත්ත්වය උසස් ලෙස පවත්වා ගැනීම සඳහා සැකසුම් සංවර්ධන අංශය සහය වේ. 2020 වර්ෂය අවසාන වන විට කර්මාන්ත 51ක GMP විගණන පරීක්ෂණ සඳහා සහභාගී විය.

5. දිසිඳි පොල් නිෂ්පාදන ආයතන මෝල් සංවර්ධන අරමුදල යටතේ නවීකරණ, සංවර්ධන කටයුතු හා නිෂ්පාදන සිදු නොවන අවස්ථා වලදී සේවක වේතන ගෙවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.

සෑම දිසිඳි පොල් නිෂ්පාදන කි.ග්‍රෑ 01ක් සඳහාම ශත 20ක මුදලක් එකී දිසිඳි පොල් නිෂ්පාදන ආයතනය නමින් පිහිටුවා ඇති දිසිඳි පොල් අරමුදල වෙත බැර කරනු ලබයි. අදාල ආයතනයේ නවීකරණ කටයුතු සඳහා එම අරමුදලින් අවශ්‍ය අවස්ථාවලදී මුදල් වෙන් කරනු ලැබේ. 2020 වර්ෂයේ වාර්ෂික දිසිඳි පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 25,255.15 වන අතර මාසික නිෂ්පාදන පහත වගුවේ පරිදි වේ.

මාසය	දිසිඳි පොල් නිෂ්පාදනය (මෙ. ටො))
ජනවාරි	2,761.35
පෙබරවාරි	2,400.15
මාර්තු	1,334.49
අප්‍රියෙල්	700.81
මැයි	2176.94
ජුනි	2969.83
ජුලි	2954.12
අගෝස්තු	2261.48
සැප්තැම්බර්	2341.65
ඔක්තෝබර්	1624.5
නොවැම්බර්	1416.28
දෙසැම්බර්	2,313.55
මුළු	**25,255.15**

වගුව 04: 2020 වර්ෂයේ මාසික දිසිඳි පොල් නිෂ්පාදනය

මෙම මුළු නිෂ්පාදන වෙනුවෙන් පොල් සංවර්ධන අධිකාරිය මෝල් සංවර්ධන අරමුදලට බැර කරන ලද මුදල රුපියල් මිලියන 5.05 කි. ඒ අනුව එක් දිසිඳි නිෂ්පාදන ආයතනයක් තම කර්මාන්තායතනයේ තෙත් අංශයේ සංවර්ධන කටයුතු සිදුකල අතර ඒ සඳහා වැයවූ රුපියල් මිලියන 1.08 ක මුදල මෙම අරමුදල හරහා ප්‍රතිපුරණය කර ගන්නා ලදී.



ප්‍රස්ථාරය 2: මාසික දිසිඳි නිෂ්පාදනය 2019 වර්ෂය හා 2020 වර්ෂය

2020 වර්ෂයේ දිසිඳි පොල් නිෂ්පාදනය, 2019 වර්ෂයට සාපේක්ෂව 50%ක පමණ පහල බැසීමක් පෙන්නුම් කෙරේ. මේ සඳහා බලපාන ලද ප්‍රධානතම සාධක වුයේ මෙම වර්ෂය තුල ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්න අනපේක්ෂිත අයුරින් පහල වැටීමත්, කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ මාස කිහිපයක් රට පුරා නිරෝධායන ඇඳිරිනීතිය ක්‍රියාත්මක වීම නිසා නිෂ්පාදන කටයුතු සීමා කිරීමට සිදු වීමත්ය.

6. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව සහන පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා පොළී ප්‍රතිදාන ලබා දීම තුළින් කර්මාන්ත සංවර්ධනය කිරීම.

මහජන බැංකුව හා ඒකාබද්ධව, කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය 2012.05.16 දින එම බැංකුව සමඟ අත්සන් කල අවබෝධතා ගිවිසුමකින් ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව, කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය 2015.02.25 දින එම බැංකුව සමඟ අත්සන් කල අවබෝධතා ගිවිසුමකින් ද ලියාපදිංචියට කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් ආකර්ෂණය කර ගැනීමට හා ඒ හරහා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කරා ලඟා කරවීම අරමුණු කර ගනිමින් අඩු පොළී සහන ණය යෝජනා ක්‍රමයන් 2 ක් ආරම්භකර පවත්වා ගෙනයනු ලැබේ .

මහජන බැංකුවේ කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය මඟින් බැංකුවේ වාණිජ පොළිය යටතේ එම ණය මුදල වාරික 60 කින් කර්මාන්තකරුවාට ගෙවීමට සලස්වා ඇත. ඔහු එකී වාරික නියමිත පරිදි බැංකුව වෙත ගෙවීමෙන් හා අදාළ කාර්යය නියමිත පරිදි සිදුකල බවට සහතික කර ගැනීමෙන් අනතුරුව වර්ෂය අවසානයේ 6% ක පොළියක් කර්මාන්තකරුට හිමි වන ලෙස ඉතිරි පොලී මුදල අධිකාරිය විසින් බැංකුව හරහා කර්මාන්තකරු වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කප්රුක ජය ඉසුර ණය යෝජන ක්‍රමය මඟින් සෘජුව කර්මාන්තකරුට 6%ක වාර්ෂික පොළියක් යටතේ ණය මුදල ලබා දෙයි. මෙම ණය යෝජනා ක්‍රම දෙකම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම දෙකක් වේ.

මහජන බැංකුවේ කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ බැංකුව වෙත කර්මාන්තකරු වෙත ගෙවීමට ප්‍රතිපූර්ණය කරනු ලබන පොළී මුදල අධිකාරියට තත්කාලීන වියදමක් වෙයි . එනමුත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගන්නා කර්මාන්තකරුවන් විසින් සෘජුව 6% ක වාර්ෂික පොළියක් යටතේ ණය වාරික බැංකුවට ගෙවන බැවින් එකී පොළිය අධිකාරියට තත්කාලීන වියදමක් නොවේ. එනමුත් මෙම ණය යෝජනා ක්‍රම දෙකින්ම කර්මාන්තකරු බැංකුවට ගෙවන 6% ක පොළියෙන් අඩක් එනම් 3% ක පොලී ප්‍රමාණයක් අධිකාරියට බැංකුව ගෙවනු ලැබේ.

එමෙන්ම පොල් සංවර්ධන අධිකාරිය හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2020.06.04 දිනැතිව අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව එතෙක් ලබා දුන් රු. මිලියන 2.0 ක ණය මුදල රු. මිලියන 3.5 ක් දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව රු. මිලියන 2.0 ක් දක්වා ණය මුදල් ලබාගෙන තිබූ කර්මාන්තකරුවන් හට රු. මිලියන 3.5 ක් දක්වා වූ ඉතිරි ණය මුදල් ලබා දීමට 2020 වර්ෂය තුලදී කටයුතු කර ඇත. මෙම අවබෝධතා ගිවිසුම සඳහා මේ වන තෙක් මහජන බැංකුව විසින් තම එකඟතාවය පල කර නොමැත.

මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ ණය ලබා ගත් කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වර්ෂය	මහජන බැංකුව		ප්‍රාදේශීය සංවර්ධන බැංකුව		එකතුව	
	ගණන	ණය මුදල රු. මිලියන	ගණන	ණය මුදල රු. මිලියන	ගණන	ණය මුදල රු. මිලියන
2012	17	11.99.	-	-	17	11.99
2013	67	47.35	-	-	67	47.35
2014	40	19.67	-	-	40	19.67
2015	31	17.54	06	7.42	37	24.96
2016	06	1.72	06	5.67	12	7.39
2017	02	1.50	05	8.40	07	9.90
2018	08	7.66	53	65.30	61	72.96
2019	07	5.65	59	70.86	66	76.51
2020	01	1.5	11	11.80	12	13.30
එකතුව	**179**	**114.58**	**70**	**172.59**	**319**	**282.02**

වගුව 05: ණය යෝජනා ක්‍රමයේ සමස්ථ ප්‍රගතිය

වර්ගය	මද ආශ්‍රිත කර්මාන්ත		වර්ගය	මද නොවන කර්මාන්ත	
පොල්තෙල්	02	3.0	කොහු	8	7.8
			අඟුරු	1	1.0
එකතුව	**02**	**3.0**	**එකතුව**	**9**	8.8

වගුව 06: කර්මාන්ත වර්ගය අනුව

වර්ෂය	අයදුම්කරුවන් ගණන	ණය මුදල රු මිලියන	මුදල් පියවීම		ගෙවීමට ඉතිරිව ඇති ණය මුදල් රු මිලියන	
2012	17	11.99	16	9.99	1	2.00
2013	67	47.35	67	47.35	-	-
2014	40	19.67	38	18.74	2	0.93
2015	31	17.54	14	5.19	17	12.35
2016	06	5.50	03	2.75	03	2.75
2017	02	1.50	01	0.50	01	1.0
2018	08	7.66	-	-	08	7.66
2019	07	5.05	-	-	07	5.05
2020	01	1.0	-	-	01	1.0
මුළු	**179**	**117.26**	**139**	**81.34**	**40**	**32.74**

වගුව 07: මහජන බැංකුවේ කප්රුක නිපැයුම් දිරිය ණය මුදල් පියවීමේ විස්තර

විස්තරය	2019			2020		
	ණය ලාභීන් ගණන	ණය මුදල (රු.මි)	අය විය යුතු ණය මුදල (රු.මි	ණය ලාභීන් ගණන	ණය මුදල (රු.මි)	අය විය යුතු ණය මුදල (රු.මි
12.31 දිනට	46	35.25	17.32	01	-	-

වගුව 08: මහජන බැංකුවේ - කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක ණයලාභීන්ගේ විස්තර

වර්ෂය	බැංකුවේ නිර්දේශය						අධිකාරියේ නිර්දේශය ලද			
	පොළී සහන ගණන		ණය මුදල රු.මි		පොළී සහන මුදල රු.මි		ගෙවූ පොළී සහන ගණන		ගෙවූ පොළී සහන මුදල රු.මි	
	2019	2020	2019	2020	2019	2020	2019	2020	2019	2020
1 වන කාර්තුව	61	30	51.7	22.41	0.46	0.24	37	17	0.42	0.19
2 වන කාර්තුව	46	03	38.17	4.5	0.28	0.11	20	01	0.26	0.005
3 වන කාර්තුව	40	13	31.54	8.9	0.24	0.12	22	05	0.23	0.058
4 වන කාර්තුව	44	-	35.25	-	0.36	-	23	-	0.25	-
එකතුව			**156.66**	**35.81**	**1.34**	**0.47**			**1.16**	**0.253**

වගුව 09: 2019 හා 2020 වසර වලට අදාළ පොළී ප්‍රතිදාන ගෙවීම්

වර්ෂය	2019	**2020**
බැංකුවේ නිර්දේශිත පොලී මුදල	1.34	0.47
අධිකාරිය මඟින් ගෙවීම්	1.16	0.253
බැංකුවේ නිර්දේශයෙන් ගෙවීම්හි ප්‍රතිශතය	**86.6%**	**53.8%**

වගුව 10: 2019 **හා** 2020 වසර වලට මහජන බැංකුවට, අධිකාරිය විසින් ගෙවන ලද අදාළ පොලී ප්‍රතිදාන සාරාංශ

020.12.31 දිනට අධිකාරිය වෙත ලද අයදුම්පත් ගණන	65
2020 වසරේ ණය ලබා දී ඇති අයදුම්පත් ගණන	19
ඊට අදාළ ණය මුදල	23,100,000.00

වගුව 11: 2020 වසරේ කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය

මෙම ණය යෝජනා ක්‍රම දෙක පිළිබඳව හා අධිකාරිය මඟින් කර්මාන්ත ක්ෂේත්‍රයට ඉටුවෙන සේවාවන් පිළිබඳවත් පොල් කටු ව්‍යාපාරය හා පොල් ලෙලි ව්‍යාපාරය ගෘහස්ථ මට්ටමින් ආරම්භ කරගනිමින් කර්මාන්ත ක්ෂේත්‍රයට ප්‍රවිශ්ඨ විය හැකි ආකාරය පිලිබඳව වැඩමුළු පවත්වන ලදී .

එසේම ණය යෝජනා ක්‍රම වල ප්‍රගතිය මෙන්ම, ක්‍රියාත්මක කිරීමේදී බැංකු ආශ්‍රිතව පැන නගින ගැටළු ද සාකච්ඡා කරමින් ණය යෝජනා ක්‍රම මඟින් කර්මාන්තකරුවන් මෙතෙක් අත් කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.

මීට අමතරව මෙම ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සුදුකමක් ලෙස අධිකාරියේ ලියාපදිංචිය ද බලපාන බැවින් ණය ලබා ගැනීමේ අරමුණ ඇතිව නව ලියාපදිංචිකරුවන් ලෙස ලියාපදිංචියේ වර්ධනයක් ද ඇති වී ඇත. එනම් ණය යෝජනා ක්‍රමය මෙන්ම අනිකුත් සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් කර්මාන්තකරුවන් අධිකාරියේ ලියාපදිංචිය සඳහා යොමු කිරීමද වක්‍රාකාරව සිදුවේ.

7. **ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් නිෂ්පාදනය හා ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් පාරිභෝගිකයින් වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රමවේද සකස් කිරීම හා ඊට කර්මාන්තකරුවන් යොමුකිරීම.**

8. **පොල් කොහු කෙඳි නිෂ්පාදනායතන වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන සහය ලබා දීම.**

කොහු කෙඳි කර්මාන්තකරුවන් හට යහපත් නිෂ්පාදන පුරුදු (GMP) සහතිකය ලබා ගැනීමට නොහැකි වීමට බලපාන ලද ප්‍රධාන සාධකයක් ලෙස වියලුම් පිට්ටනියක් නොමැති වීම විගණන අධීක්ෂණ වලදී හඳුනා ගන්නා ලදී. ඒ අනුව වියලුම් පිට්ටනි නොමැති කොහු කෙඳි කර්මාන්තකරුවන් වෙත ආයෝජන සහය ලබා දීමේ ව්‍යාපෘතියක් 2017 වසරේ සිට ආරම්භ කරන ලදී. 2020 වසරේ වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් 2019 වසරේ තෝරාගන්නා ලද කර්මාන්තායතන 04ක් සහ 2020 වසරේ තෝරා ගන්නා ලද කර්මාන්තායතන 28ක් වෙත ආයෝජන සහය ලබා දෙන ලදී. 2020 වසරේදී වියළීමේ ක්‍රමවේදය තවදුරටත් විධිමත් කිරීම සඳහා සංශෝධිත වියලුම් පිට්ටනි සඳහාද ආයෝජන සහය ලබාදෙන ලදි. ඒ අනුව 2020 වර්ෂයේ කොහු කෙඳි කර්මාන්තකරුවන් 32 දෙනෙකු සඳහා වියලුම් පිට්ටනි සඳහා ආයෝජන සහය ලබා දීමට හැකි විය. 2020 වසර සඳහා ලබා දෙන ලද ආයෝජන සහය රුපියල් ලක්ෂ හතරක උපරිමයකට යටත්ව සිදු කෙරුණි.





රූපය 01 : ආයෝජන සහය ලබා දුන් වියලුම් පිටි

පොල් කොහු කෙඳි නිෂ්පාදනවල තත්ත්වය ඉහල නැංවීම හා එමඟින් ස්ථායි වෙළඳපොල හිමිකර ගැනීමේ අවස්ථා පොල් කොහු කෙඳි නිෂ්පාදන කර්මාන්තකරුවන් වෙත ලඟාකරවීමේ අරමුණින් යහපත් නිෂ්පාදන භාවිතාවන් සහතිකකරණය (Good Manufacturing Practices/ GMP) පොල් කොහු කෙඳි කර්මාන්තය වෙත හඳුන්වා දෙන ලදී. ඒ අනුව අධිකාරියේ අධීක්ෂණය යටතේ කර්මාන්තායතන විගණනය කරන ලදී.

විගණනයේ අඩුපාඩු සම්පූර්ණ කර පළමුවරට සහතිකපත් ලබා ගන්නා ලද කර්මාන්තායතන 07 ක් වෙත GMP සහතිකය සඳහා වැයවූ මුදල, උපරිමය රු. 30,000/- කට යටත්ව ප්‍රතිපූර්ණය කරන ලද අතර සහතිකකරණය සඳහා ප්‍රවාහන පහසුකම් අධිකාරිය විසින් සපයන ලදී.

9. නිලධාරීන්ගේ කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවා නියුක්තිය සඳහා නිපුණතා සංවර්ධනය කිරීම.

සැකසුම් සංවර්ධන අංශය වෙත පැවරී ඇති කාර්යයභාරය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර ගැනීමේ අවශ්‍යතාවය මත හා අංශයේ කාර්ය මණ්ඩලය මඟින් වඩාත් ප්‍රශස්ථ මට්ටමින් රාජකාරී ඉටුකරවා ගැනීමේ අරමුණින් 2020 වර්ෂයේදීද ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු හා මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඒ අනුව එම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

එහිදී මූලික වශයෙන් විගණන පුහුණු හා රාජකාරීමය අවශ්‍යතාවය මත ISO, HACCP හා GMP සහතිකකරණය සම්බන්ධ වැඩමුළු හා වෙනත් තත්ත්ව කළමනාකරණ පාඨමාලාවන් සඳහා සැකසුම් සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලය සහභාගී කරවන ලදී.

2020 වර්ෂය සඳහා දේශීය පුහුණුවීම් 32ක් පමණ සැලසුම්කර තිබුනද, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එම පුහුණුවීම් වලින් සිදුකරගත හැකිවුයේ වැඩසටහන් 04 ක් පමණි.

10. සැකසුම් සංවර්ධන අංශයේ පරීක්ෂණ ඒකකය වෙත පරීක්ෂා කිරීම් සඳහා වූ ISO 17020:2012 ප්‍රතිතන/ අනුකූලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කිරීම.

2019/09/19, 20 සහ 23 යන දිනයන්හිදී පැවැත්වූ මූලික තක්සේරුවේදී අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය මඟින් පෙන්වා දෙන ලද නොගැළපීම් (Non Confotmities) සහ නිරීක්ෂණ (Observations) සඳහා නිවැරදි කිරීම් සිදුකරන ලදී. එම නිවැරදි කිරීම් සිදුකිරීමෙන් පසුව, දිසිඳි පොල් නියැඳි ලබාගැනීම සහ පරීක්ෂා කිරීම් (Inspection & sampling) සඳහා ISO 17020:2012 ප්‍රතිතන සහතිකය, අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය (SLAB) විසින් 2020/03/01 දින ප්‍රධානය කරන ලදී.

2020/09/24 සහ 2020/09/30 දෙදින පැවැත්වූ පළමු නිරීක්ෂණ විගණනයෙන් (1st servaillance audit) පෙන්වාදෙන නොගැළපීම් (Non Conformities) සඳහා නිවැරදි කිරීම් සිදුකර මෙම ප්‍රතිතනය තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාමට අනුමැතිය ලබා ගන්නා ලදී.

ප්‍රතිතන සහතිකය ලබාගැනීමෙන් පසු, නැවුම් පොල් තෙල්, පොල් කිරි, පොල් වතුර සහ කොහුබත් උපස්ථර යන නිෂ්පාදන සඳහා ද ප්‍රතිතන සහතිකය ලබාගැනීමට අවශ්‍ය මූලික ලියකියවිලි සකස් කිරීම ආරම්භ කරන ලදී. නමුත්, 2020 වසරේ ඇතිවූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එම කටයුතු යම් පසුබෑමකට ලක්වුවද, 2021 වසරේදී මෙම කටයුතු තවදුරටත් ඉදිරියට කරගෙන යාමට නියමිතය.

11. අවිධිමත් කර්මාන්ත සඳහා අගය වැඩි කල නිෂ්පාදන හඳුන්වාදීම සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, උපකරණ ලබා දීම.

1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත යටතේ සෘජුව ආවරණය නොවන අවිධිමත් පොල් කර්මාන්ත සංවර්ධනය කර එම ක්ෂේත්‍ර ශක්තිමත් කිරීම සඳහා නව ව්‍යාපෘති ඒකකයක් ස්ථාපනය කරන ලදී.

පොල් හා පොල් ආශ්‍රිත සුළු පරිමාණ අවිධිමත්ව සිදු කරනු ලබන කර්මාන්ත විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් සිදු කරනු ලබන අතර ඇතැම් කර්මාන්ත දේශීය හා විදේශීය වෙළඳපොලට නිෂ්පාදන ද්‍රව්‍ය සපයනු ලැබේ.මේවා අතරින් වැඩිමනත් කර්මාන්ත අපනයනය අරමුණු කර ගනිමින් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලැබේ.මෙම කර්මාන්ත දිවයින පුරා ව්‍යාප්තව ඇති අතර ගෘහස්ථ හා සාමුහිකව සිදු කරනු ලැබේ. අධිකාරිය මඟින් පවත්වන පුහුණු වැඩසටහන් මඟින් කොහු භාවිතා කර කොසු සැකසීම ,පාපිසි නිෂ්පාදනය,තවාෂි බුරුසු සැකසීම, ලනු නිෂ්පාදනය සහ පොල් ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධව දිවයින පුරා පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.මෙම වැඩ සටහන් වල ප්‍රතිඵලයක් ලෙස අමුද්‍රව්‍ය නාස්තිය අවම කිරීම සහ අඩු ආදායම්ලාභීන් සඳහා ස්වයං රැකියා ආරම්භ කර ආදායම් උත්පාදනයට හැකියාවක් ලැබී ඇත.

මීට අමතරව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ ඉල්ලීම පරිදි මත්ද්‍රව්‍ය සඳහා යොමුවූ පිරිස් සමාජගත කිරීමේ කාර්යයේ එක් අංගයක් ලෙස පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා පුහුණුව ලබාදීම පොල් සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරනු ලබයි. මෙම වැඩසටහන් කන්දකාඩු, සේනපුර හා වව්නියාව පුනරුත්ථාපන මධ්‍යස්ථාන වල කාර්යාංශයේ ඉල්ලීම පරිදි සංවිධානය කරනු ලැබේ. වැඩසටහන සඳහා වැයවන මුදල පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මඟින් ප්‍රතිපූරණය කරන අතර පළමු වැඩ සටහන ලෙස සේනපුර සේනපුර, තෘතීක හා වෘත්තීය අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකයින් සඳහා ඉදල් කොසු පුහුණු වැඩ සටහනක් පවත්වන ලදී.

පොල් ආශ්‍රිත සුළු පරිමාණ, ගෘහස්ති කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා සම්පත් බහුල ප්‍රදේශ ප්‍රමුඛ කර ගනිමින් ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පුද්ගලික අංශයේ ඉල්ලීම් සැළකිල්ලට ගනිමින් පුනරුත්ථාපන මධ්‍යස්ථාන වල සහ ජාත්‍යන්තර පොල් දිනයට සමගාමීව පහත ස්ථානවල පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

පැවැත් වූ දිනය	පුහුණු වැඩ සටහන	ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
2020/03/02-2020/03/04	ඉදල් හා කොසු නිෂ්පාදන පුහුණු වැඩසටහන	සේනපුර	75
2020/08/27-2020/08/28	බුරුසු නිෂ්පාදන පුහුණු වැඩසටහන කප්රුක සමිති සාමාජිකයින් සඳහා	වැල්ලවාය	25
2020/08/20-2020/08/22	පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදන පුහුණු වැඩසටහන	පන්විල	20
2020/09/10-2020/09/12	බුරුසු නිෂ්පාදන පුහුණු වැඩසටහන	ආණමඩුව	30
2020/09/3-5	බුරුසු නිෂ්පාදන පුහුණු වැඩසටහන	ඉපලෝගම	25

වගුව 12 : 2020 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩ සටහන්





රූපය 02 : පුහුණු වැඩසටහන්

මහා පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය කප්රුක සමිති සාමාජිකයින් හරහා එකතු කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩ සටහන් 3 ක් කලුතර, හික්කඩුව සහ කෑගල්ල ප්‍රදේශවල කප්රුක සමිති වල නිලධාරීන් සහ කප්රුක අරමුදල් මණ්ඩලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. අපතේ යන පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය කර්මාන්තකරුවන් වෙත ලබාදීමට කප්රුක සාමාජිකයන් එකඟ වෙන ලදී .

මීට අමතරව ජාත්‍යන්තර පොල් දිනයට සමගාමිව පහත දැනුවත් කිරීමේ වැඩ සටහන් සහ ප්‍රදර්ශන දේශීය මට්ටමින් පවත්වන ලදී.

දිනය	**දැනුවත් කිරීමේ වැඩ සටහන**	**ස්ථානය**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
2020/08/24	නිවැරදිව හා නිසි ප්‍රමිතයෙන් පොල් කටු අඟුරු නිෂ්පාදනය සිදු කරන අයුරු ප්‍රායෝගිකව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම සහ පරිසර බලපත්‍රය ලබා ගැනීම සම්බන්ධව දැනුවත් කිරීම	ගම්පහ	30
2020/09/08	පිරිසිදු පොල්තෙල් නිෂ්පාදනය කිරීම සම්බන්ධව දැනුවත් කිරීම	ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	15
2020/09/03	පෙට්ටි කුට්ටම් ක්‍රියාකරුවන්ගේ හිඟය නිසා අභාවයට යමින් පවතින බ්‍රිස්ටල් කෙඳි කර්මාන්තය නඟා සිටුවීමට පහසුවෙන් ක්‍රියා කරවිය හැකි නව යන්ත්‍රයක් සම්බන්ධව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම	බෝයවලාන කොහු කර්මාන්ත ශාලාව	26

වගුව 13 : දැනුවත් කිරීමේ වැඩසටහන්

දැනුවත් කිරීමේ වැඩ සටහන්




රූපය 03 : දැනුවත් කිරීමේ වැඩසටහන්

ප්‍රදර්ශන





රූපය 04 : ප්‍රදර්ශන

ජාත්‍යන්තර පොල් දිනයට සමගාමී ලෙස පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් පොළොන්නරුව පරාක්‍රම සමුද්‍ර භූමි පරිශ්‍රයේ සංවිධානය කරන ලද ප්‍රදර්ශනයට අධිකාරිය සහභාගී වන ලදී. මෙම ප්‍රදර්ශනයේදී පොල් වගාකරුවන් සඳහා ප්‍රදේශයේ සම්පත් භාවිතා කර කර්මාන්ත ආරම්භ කිරීමට ඇති විභවතාව සම්බන්ධව පැහැදිලි කිරීමක් සිදු කරන ලදී. අධිකාරිය මඟින් ප්‍රදර්ශන කුටියක් ස්ථාපිත කරන ලදී.

උපකරණ සහ ආයෝජන සහාය ලබා දීම

පොල් හා පොල් ආශ්‍රිත සුළු පරිමාණ අවධිමත්ව සිදු කරනු ලබන කර්මාන්ත විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් සිදු කරනු ලබන අතර, මේවා අතරින් වැඩිමනත් කර්මාන්ත අපනයන අරමුණු කරගනිමින් සිදු කරනු ලැබේ. මෙම කර්මාන්ත දිවයින පුරා ව්‍යාප්තව ඇති අතර බහුල සේවා නියුක්තිකයින් සහිතව ගෘහස්ථව හා සාමූහික ඒකක ලෙස සිදු කරනු ලැබේ. ගුණාත්මක නිෂ්පාදන සිදු කරලීම සඳහා අඩු ආදායම්ලාභීන් වෙත උපකරණ හා මෙවලම් ලබා දීමට කටයුතු කරන ලදී.කප්රුක සමිති සාමාජිකයින් සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් පොල් සංවර්ධන අධිකාරිය, කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ කප්රුක අරමුදල යන ආයතන එක්ව ලනු ඇඹරීමට අත් යන්ත්‍ර 200 ක් අඩු ආදායම්ලාභී කප්රුක සමිති සාමාජිකයින් වෙත ලබා දීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී . එම කප්රුක සමිති සාමාජිකයන් සඳහා දැනට අත්යන්ත්‍ර 100ක් ලබා දීමට කටයුතු කර ඇත.





රූපය 05 : උපකරණ ලබාදීමේ වැඩසටහන්

<u>ලබා දෙන ලද උපකරණ</u>

1. ඉපලෝගම කප්රුක නිෂ්පාදන සමිතිය - තවාශි බුරුසු නිෂ්පාදන යන්ත්‍ර 15
2. ඩබ්ලිව්.ජී, ලීලාවතී මිය, අංක 825, දුටුවැව - පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන උපකරණ කට්ටල (බෙන්ච් ග්‍රයින්ඩර්,බෙන්ච් ඩ්‍රිල්,පෙන්ඩන්ට් මෝටර්)
3. ඒ.ජී උදය කුමාර ප්‍රියදර්ශන මයා, 404/2/29, කොත්ලෙපුර, තඹුත්තේගම - පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන උපකරණ කට්ටල 1(බෙන්ච් ග්‍රයින්ඩර්,බෙන්ච් ඩ්‍රිල්,පෙන්ඩන්ට් මෝටර්)
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තිහගොඩ - ට්‍රිමර් යන්ත්‍ර 2
5. සී.පී.ජානකී නයනා කුමාරි මිය, අලංකාරේ, මොරගහේ - ට්‍රිමර් යන්ත්‍ර 01

12. පරිසර හිතකාමී පොල්කටු දහන උඳුන් ඉදි කිරීම සඳහා අවිධිමත් අංශයේ කර්මාන්තකරුවන් වෙත ආයෝජන සහය ලබා දීම හා බ්‍රිස්ටල් කෙඳි නිෂ්පාදන යන්ත්‍ර සඳහා ආයෝජන සහය ලබා දීම.

තත්ත්වයෙන් උසස් පොල්කටු අඟුරු නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් දිරිමත් කිරීම සඳහා ,යෝග්‍ය තාක්ෂණය ලබා ගැනීම වෙනුවෙන් කර්මාන්තකරුවන් 8 දෙනකු සඳහා ආයෝජන සහාය ලබා දෙන ලදී. පොල්කටු අඟුරු හා ඒ ආශ්‍රිත වටිනාකමින් යුත් අඟුරු නිෂ්පාදන ඒකක ආරම්භ කරන ව්‍යවසායකයින් සංවිධානගත කර සකසුරුවම්භාවය පුරුදු කර සමාජ ආර්ථික මට්ටම ඉහළ නැංවීම සහ පරිසර හිතකාමී ලෙස ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීම දිරි ගැන්වීම මේ යටතේ සිදු කරනු ඇත.

බ්‍රිස්ටල් කෙඳි නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් එය අමුද්‍රව්‍යය වශයෙන් යොදා ගන්නා බුරුසු සැකසීමේ කර්මාන්තය දුෂ්කරතාවට පත්ව ඇත.මේ සඳහා පිළියමක් ලෙස ආරක්ෂිත ලෙලි දමන යන්ත්‍රය සහිත බ්‍රිස්ටල් කෙඳි ලබා ගැනීම සඳහා යන්ත්‍ර 2 ක් සඳහා ආයෝජන සහය ලබා දෙන ලදී.

02. තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

තත්ත්ව පාලන කටයුතු පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අපනයන තොග වල ගුණාත්මකභාවය සහතික කිරීම, විවිධ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා පරිදි පරීක්ෂණ පහසුකම් සැපයීම, පොල් නිෂ්පාදන දේශීය වෙළඳපොලට යොමු වීමේදි පරීක්ෂා කොට සහතික නිකුත් කිරීම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා උපදේශකත්වය සැපයීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධාන වගකීමයි.

අංශයේ කාර්යයන්;

1. **අපනයනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම හා තත්ත්වය සහතික කිරීම**

   - **දිසිඳි පොල් හි ක්ෂුද්‍රජීවී හා භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම**
     පොල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම මද ආශ්‍රිත නිෂ්පාදනය වන දිසිඳි පොල් කර්මාන්තය ප්‍රධාන වශයෙන් මනා තත්ත්ව පාලනයකට යොමු කරන අතර දෛනික දිසිඳි පොල් නිෂ්පාදන සියල්ල තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේදී දිනපතා පරීක්ෂාවට භාජනය කෙරේ. අපනයනය සඳහා යොමුවන මෙම නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම පිණිස මෙම පරීක්ෂණ ප්‍රතිඵලදායක වේ.

   - **කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන - පරීක්ෂා කිරීම**

2. **පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන්, අපනයනකරුවන් හා පාරිභෝගික ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාවක් ලෙසට රසායනාගාර පරීක්ෂණ සේවා, සහන ගාස්තු ක්‍රමයක් යටතේ සිදුකිරීම**

   ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ප්‍රමිතින් හි දැක්වෙන ක්ෂුද්‍රජීවී හා භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීමේ හැකියාව පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය සතු වන අතර පොල් කර්මාන්තයේ නියැළි ව්‍යවසායකයන්ගේ අභිවෘද්ධිය සඳහා කඩිනම් පරීක්ෂණ සේවාවන් ලබාදීමට සෑම විටම කටයුතු කරනු ලැබේ.

3. **දිසිඳි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී, භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම**

   අධිකාරියේ රසායනාගාරයේ සිදුකරන පරීක්ෂා හැරුණු කොට දිසිඳි පොල් නිෂ්පාදනාගාර ආශ්‍රිත දිසිඳි හා ජල ආදර්ශ රැස්කොට පරීක්ෂා කර ප්‍රතිඵල සපයා පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු . හා නිෂ්පාදනයන්හි උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා දායකවේ.

4. **තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනික හා ක්ෂුද්‍රජීවී රසායනාගාර සඳහා ISO 17025 තත්ත්වය පවත්වා ගැනීමේ කටයුතු සිදුකිරීම.**

5. පොල් තෙල් කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීම හා නගාසිටුවීම අරමුණු කරගනිමින් අදාල පරීක්ෂණ සිදුකිරීමට පොල් තෙල් නිෂ්පාදනාගාරයන් හි සෞඛ්‍යාරක්ෂිත භාවය පරීක්ෂා කිරීම හා පොල් තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය වන කොප්පරා, නිෂ්පාදිතය වන පොල් තෙල් හා එහි අතුරුඵලය වන පුන්නක්කු ශ්‍රී ලංකා ප්‍රමිතින්ට අනුකූල වන්නේදැයි පරීක්ෂා කිරීම.

6. දේශීය වෙළඳපොලෙහි පවතින මිශ්‍ර පොල් තෙල් හඳුනාගැනීමේ පරීක්ෂා සිදුකිරීමේ සහ අපගමනය වීම පරිභෝගික අධිකාරියට සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත දැනුම් දීම. පොල් තෙල් නිෂ්පාදනයන්හි තත්ත්වය පරීක්ෂා කිරීම සිදුකරන අතර හඳුනාගත් මිශ්‍ර පොල් තෙල් විකුණුම්කරුවන් පිළිබඳ විස්තර පාරිභෝගික කටයුතු පිළිබඳ වන පාරිභෝගික අධිකාරිය සහ ආහාරමය ද්‍රව්‍ය සඳහා පාලනමය බලතල ඇති ආයතනය වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත සපයා එකී ආයතන සමඟ එක්ව කටයුතු කර මිශ්‍ර පොල් තෙල් අනුභවයෙන් පාරිභෝගික ජනතාව රැකගැනීම සඳහා සේවාවන් සැපයීම

7. පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව පැන නැගෙන දේශීය හා විදේශීය පැමිණිලි හමුවේ නිෂ්පාදන පරීක්ෂණ සිදුකිරීම.

8. පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රදර්ශණ සඳහා සහභාගී වීම

9. ආහාරමය වෙනත් නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාවන් පවත්වා ගෙන යාම.

10. වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ප්‍රමිතින් යාවත්කාලීන කිරීම සහ දැනට ප්‍රමිතින් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සම්බන්ධවී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

11. පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ පවතින රසායනාගාරයන්හි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය උදෙසා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

මේ අනුව ගුණාත්මක පොල් නිෂ්පාදන බිහිකිරීමත්, ඒ අනුව දේශීය හා විදේශීය වෙළඳපල වර්ධනය වීමත් අපේක්ෂා කරමින් පොල් නි, වාර්ෂිකපරීක්ෂා කිරීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකර ඇත. මෙකී සියළු කාර්යයන්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මකට අනුව සිදුකරනු ලබන අතර 2020 වාර්ෂික ප්‍රගතිය පහත පරිදි වේ.

Q1 අපනයනය සහ දේශීය පාරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හි තත්ත්වය සහතික කිරීම.

A පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරීම

පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන්හි පරීක්ෂණ කටයුතු ලෙස ප්‍රධාන වශයෙන් දිසිඳි පොල් සඳහා පරීක්ෂණ කටයුතු සිදු වේ. දිසිඳි පොල් නිෂ්පාදනාගාරයන්හි සිදුවන දෛනික නිෂ්පාදන, සැල්මොනෙල්ලා පරීක්ෂාවට භාජනය කිරීම, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ක්ෂුද්‍රජීවී රසායනාගාරයේදී සිදු කෙරේ. මේ අනුව අපනයනය සඳහා යොමුවන දිසිඳි පොල් නිෂ්පාදනයන් සියල්ල පරීක්ෂාවට භාජනය කෙරේ.

2020 වසර සඳහා දෛනික දිසිඳි පොල් නිෂ්පාදන ආදර්ශ 7000 ක ඉලක්කයක් තිරණය කරන ලදි. ආදර්ශ 5935ක් සැල්මොනෙල්ලා සඳහා පරීක්ෂා කර 2020 වසරේදි මෙම පරීක්ෂණ වෙනුවෙන් 85% ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. දිසිඳි ආදර්ශ පරීක්ෂා කිරීමට යොමුවීම එම නිෂ්පාදන ධාරිතාව මත රඳා පවති.



	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
ආදර්ශ ප්‍රමාණය	6532	10223	9318	6498	11609	9597	11265	7097	6060	10000	5935
නිෂ්පාදනය MT	28850	46620	41645	29200	50368	41795	51219	29557	24625	44081	25255

ප්‍රස්ථාරය 03 : දිසිඳි පොල් නිෂ්පාදන හා ආදර්ශ ලැබීම

2019 වසරේදි පරීක්ෂාවට භාජනය කල දිසිඳි පොල් නිෂ්පාදන අතුරින් ආදර්ශ 09ක් සැල්මොනෙල්ලා විෂගතවීම වාර්තා විය. ප්‍රතිශතයක් ලෙස විෂගත වීම් 0.09%කි. 2020 වසරේදි විෂගතවීම ආදර්ශ 02ක් වන අතර 2020 වසරේදි ක්ෂුද්‍රජීවී පරීක්ෂාවට භාජනය කල දිසිඳි පොල් ආදර්ශයන්හි ප්‍රතිශතයක් ලෙස ගත්කල මෙය 0.03% වේ.



ප්‍රස්ථාරය 04 : සැල්මොනෙල්ලා විෂගතවීම් - දිසිඳි පොල් දෛනික ආදර්ශ

වසර	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
විෂගතවීම් ප්‍රතිශතය %	0.12	0.2	0.08	0.14	0.15	0.27	0.4	1.2	0.26	0.09	0.03

වගුව 14: විෂගතවීම් ප්‍රතිශතය %

පුර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණය සිදුකිරීම සඳහා මද නොවන නිෂ්පාදන අතුරින් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයි. 2019 වසරේදි ආදර්ශ 1135ක් පරීක්ෂා කර ඇති අතර 2020 වසරේදි ආදර්ශ 1210ක් පරීක්ෂා කර ඇත. මෙම ආදර්ශ 1210 හි පරීක්ෂණ 1472ක් සිදුකර ඇත. මෙම ආදර්ශ පරීක්ෂා කිරීම සිදුකරනු ලබන්නේ ඉල්ලුම්කරුවන් විසින් සඳහන් කරනු ලබන පරාමිතීන් සඳහා වේ. 2020 වර්ෂයේදි කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව, වැඩි ප්‍රමාණයක් පරීක්ෂා සඳහා භාජනය වී ඇත. ප්‍රගතිය 121%කි. මෙම ආදර්ශයන්හි සැල්මොනෙල්ලා සහ ඊ-කොලි පරීක්ෂාවන් සිදුකරනු ලැබේ. පරීක්ෂා කල ආදර්ශ අතුරින් සැල්මොනෙල්ලා විශගතවීම් එක් ආදර්ශයක් පමණක් වාර්තා වී ඇත. එක් ආදර්ශයක් ඊකෝලයි බැක්ටිරියාව සඳහා වන ප්‍රමිති සීමාවන් ඉක්මවා ඇත.



	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
ආදර්ශ ප්‍රමාණය	687	831	615	900	640	645	800	840	596	647	872	928	1135	1210
ඉලක්කය	750	750	800	600	900	600	650	800	700	750	800	875	1000	1000

ප්‍රස්ථාරය 05 : කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ක්ෂුද්‍රජීවී පරීක්ෂාව

B දිසිඳි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම සහ සහතික කිරීම.

භෞතික හා සංවේදි පරීක්ෂා ලෙස, දිසිඳි පොල් හි වර්ණය, වර්ග කිරීම, තෙතමනය, රස, සුවඳ, අපද්‍රව්‍ය, කුරුටු, තෙල් බේරීම යන පරීක්ෂා ප්‍රධානව සිදුකර ඇත.

මේ අනුව 2019 වසරේදි ආදර්ශ 10121ක් පරීක්ෂා කර ඇති අතර 2020 වසරේදි ආදර්ශ 6006 ක් පරීක්ෂා කර ඇත. මෙම ආදර්ශ 6006 හි සිදුකර ඇති සම්පූර්ණ පරීක්ෂණ ගණන 48048 කි. 2020 වසරේ ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 86%කි.

2019 වර්ෂය තුල



ප්‍රස්ථාරය 06 : දෛනික දිසිඳි පොල් නිෂ්පාදනයන්හි භෞත රසායනික පරීක්ෂාව

පරීක්ෂණයට භාජනය කල දිසිඳි ආදර්ශ 10121 අතුරින් ආදර්ශ 1072ක් එනම් 11%ක් භෞතික ලක්ෂණයන්හි අඩුපාඩු පෙන්නුම් කරන ලද අතර 2020 වර්ෂයේදී පරීක්ෂා කල ආදර්ශ 6006න් ආදර්ශ 641 එනම් 11%ක් එම අඩුපාඩු පෙන්වා ඇත. මේ අනුව භෞතික ලක්ෂණයන්හි ප්‍රමිතියානුකූල නොවීම 2020 වර්ෂයේදි වැඩිවීමක් හෝ අඩුවීමක් සිදුවී නොමැත. මෙලෙස ශ්‍රී ලංකා ප්‍රමිතිය හා එකඟ නොවූ ආදර්ශ අතුරින් වැඩිම ප්‍රතිශතය වන 57% ක් වර්ණය අනුව ප්‍රමිතියට නොගැලපීමකි. තත්ත්ව දෝෂ පහත පරිදි වේ.

පරාමිතිය	එකඟ නොවූ ආදර්ශ	
	ගණන	%
වර්ග කිරීම	265	41
වර්ණය	365	57
මුඩු බව	02	0.3
තෙතමනය	43	6.7
දැවුනු කැබලි	301	47
කර ගඳ	34	5.3
දුම් ගඳ	0	0
බාහිර අපද්‍රව්‍ය	15	2.3
කුරුටු	116	18
තෙල් බේරීම	2	0.3
තෙල් සහිතවීම	2	0.3
කර රස	15	2.3
පුළුණු ගඳ	0	0

වගුව 15 : ආදර්ශ පරාමිතීන් කිහිපයකින් ප්‍රමිතිය හා එකඟ නොවූ පරීක්ෂා කිරීම්

Q2. පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවා පවත්වා ගැනීම

දේශීය නිෂ්පාදකයන්ගේ විවිධ පොල් නිෂ්පාදන විශ්ලේෂණය කිරීමේ සේවාව පවත්වා ගැනීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකරයි. ක්ෂුද්‍රජීවී පරීක්ෂා, රසායනික පරීක්ෂා, භෞතික පරීක්ෂා සහ සංවේදී පරීක්ෂා මේ යටතේ සිදු කෙරේ. මෙම සේවාව සාධාරණ මිලකට, සිදුකරන අතර ඉල්ලුම්කරුගේ අවශ්‍ය පරාමිතින්ට අදාළව පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලැබේ. පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්, පාරිභෝගික ජනතාව, සුළු, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳමහතුන් සහ අපනයනකරුවන් ආදී වූ ඕනෑම කාණ්ඩයක් සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාව ලබා දෙනු ලැබේ.

දිසිඳි පොල්, මද වශයෙන් මේදය ඉවත් කල දිසිඳි පොල්, කොප්පරා, පොල් කෙඳි, පොල් තෙල්, පුන්නක්කු, කොහු බත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන පොල් පිටි මෙන්ම වෙනත් විවිධ පොල් නිෂ්පාදන ද්‍රව්‍යයන් ශ්‍රී ලංකා ප්‍රමිතියට අදාලව පරීක්ෂා කිරීමේ හි රසායනාගාර සේවාව පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා අවශ්‍ය වන නවීන රසායනාගාර උපකරණ, තත්ත්ව පාලන අංශය සතු වන අතර කඩිනම් ප්‍රතිඵල ලබාදීම තත්ත්ව පාලන අංශයෙන් සිදුකරනු ලැබේ.

ප්‍රමිතියානුකූල ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා පරීක්ෂා කර එහි තත්ත්වයන් පිළිබඳව අවබෝධය ලබා ගැනීම උදෙසා නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහාත්, ශ්‍රී ලාංකිකභාවය රැකෙන පරිදි තත්ත්වයෙන් උසස් පොල් නිෂ්පාදන නිරතුරුව විදේශීය වෙළඳපල කරා යොමු කරවීම පිණිස අපනයනකරුවන් දිරිගැන්වීම සඳහාත්, පොල් සංවර්ධන අධිකාරියෙහි ඉහත කී ලියාපදිංචි කාණ්ඩ සඳහා පරීක්ෂණ ගාස්තුවෙන් 15% ක වට්ටම් ගාස්තුවක් ලබාදේ.

පරීක්ෂා කර ගැනීම සඳහා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රධාන වශයෙන් යොමුවන අතර 2019 වසරේදී ආදර්ශ 988ක් පරීක්ෂා කර ඇත. 2020 වසර තුල ආදර්ශ 867ක් විශ්ලේෂණය කර ඇත. ඉලක්කය වන ආදර්ශ 900ට සාපේක්ෂ ප්‍රගතිය 96% වේ. මෙම ආදර්ශ 867 හි සිදුකර ඇති සම්පූර්ණ පරීක්ෂණ ගණන 1521 කි. 2020 වසරේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අතුරින් සල්ෆඩයොක්සයිඩ් හා ඇෆ්ලටොක්සින් පරීක්ෂණ සඳහා පමණක් දිසිඳි ආදර්ශ 453ක් විශ්ලේෂණය කර ඇත. පොල් තෙල් ආදර්ශ පරීක්ෂාවද 2019 වසරට සාපේක්ෂව සැළකිය යුතු පරිදි ඉහල ගොස් ඇත. මේ යටතේ පරීක්ෂා කල සියළුම ආදර්ශ වර්ග පහත දැක්වේ.



ප්‍රස්ථාරය 07 : පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පරීක්ෂා කිරීමේ සේවාවන් පවත්වා ගැනීම

වර්ෂය	දිසිඳි පොල් (ආදර්ශ)	චූන්නාක්කු (ආදර්ශ)	පොල් තෙල් (ආදර්ශ)	කොප්පරා (ආදර්ශ)	මේදය ඉවත් කරන ලද දිසිඳි පොල් (ආදර්ශ)	Coconut spread(ආදර්ශ)	පොල් ක්‍රීම් /කිරම (ආදර්ශ)	සිපි කළ පොල් (ආදර්ශ)	පොල් කිරි(ආදර්ශ)	පොල් හොබන ආදර්ශ	දිසිඳි පොල් ආදර්ශ ඇල්ලටොක්සින් හා සල්ෆර් යොදාසිසිඩ්	Row coconut flaks	King coconut water
2014	122	5	161	4	81	--	11	--	--	05	710	-	-
2015	35	10	158	3	105	01	11	01	--	01	214	-	-
2016	58	2	191	1	112	--	4	--	--	--	374	-	-
2017	42	-	332	-	121	-	07	-	--	-	366	-	-
2018	13	-	344	-	141	-	01	--	--	07	417	02	-
2019	18	1	213	1	66	--	5	--	2	15	667	--	-
2020	08	3	335	--	51	--	03	02	03	04	453	--	05

වගුව 16 : පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පක්කිරීම සේවාවන් පවත්වා ගැනීම

Q3. A) ISO තත්ත්ව සහතිකය ලබා ගැනීමේ කාර්යයන්

පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය මඟින් නිකුත් කරනු ලබන පරීක්ෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරීක්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමාණුකූලව සිදුකිරීම සඳහා, ISO 17025 ප්‍රතිතන තත්ත්වයට අදාල කාර්යයන් අංශයෙහි පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව වාර්ෂිකව උපකරණ ක්‍රමාංකනය කිරීම, ජාත්‍යන්තර හා දේශීයව Inter laboratory සහ Intra laboratory වෘත්තීමය කුසලතා ඇගයීමේ පරීක්ෂණ සඳහා පෙනී සිටීම සිදුකර ඇති අතර ප්‍රතිඵල සතුටුදායක මට්ටමේ පවති.

පොල් තෙල් පරීක්ෂණ ක්‍රමවේදයන් සඳහා තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනික විශ්ලේෂණ අංශය විසින් ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පිරිනමනු ලබන ISO 17025 තත්ත්ව සහතිකය, 2012 වසරේදී අත්කර ගනු ලැබූ අතර 2020 වසරේදී පැවති සුපරීක්ෂණ පරීක්ෂාවෙන් සමත්ව 2023 ජූනි මස 29 දින දක්වා ප්‍රතිතන තත්ත්වය දිර්ඝ කරන ලදි.

දිසිඳි පොල් හි ක්ෂුද්‍රජීවී පරීක්ෂණ වන සැල්මොනෙල්ලා, සම්පූර්ණ ඝණාවාස සංඛ්‍යාව, දිලීර හා පුස් සංඛ්‍යාව, කොලිෆෝම් සංඛ්‍යාව, ඊ. කෝලයි සංඛ්‍යාව සඳහා 2020 ජනවාරි මස පැවති සුපරීක්ෂණ පරීක්ෂණයෙන් සමත්ව ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පිරිනමනු ලබන ISO 17025 ප්‍රතිතන තත්ත්වය 2023 ජූනි මස 29 දින දක්වා දිර්ඝ කරන ලදි.


SLAB
SRI LANKA ACCREDITATION BOARD

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that

Chemical and Microbiology Laboratory
Quality Control and Quality Assurance Division
Coconut Development Authority

having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 :2017, has been accredited as a testing laboratory under the field of

Chemical and Biological Testing

and has been assigned the accreditation number
TL 030 - 01

This certificate is issued on 30 June 2020 and is valid until

29 June 2023

The accreditation was granted for the first time for Chemical laboratory on 2012-06-12 and Microbiology laboratory on 2015-10-15.

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.

Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

රූපය 06 : SLAB සහතික පත



As an accredited laboratory, this laboratory is entitled to use the following accreditation symbol.

Valid from 30 June 2020
to 29 June 2023
Issued on 30 June 2020

ISO/ IEC 17025
TL 030-01

Schedule of Accreditation

Accreditation Scheme for Testing Laboratories
Sri Lanka Accreditation Board for Conformity Assessment
Accreditation Number: TL 030-01

Chemical & Microbiology Laboratory
Quality Control and Quality Assurance Division
Coconut Development Authority
No. 54, Nawala Road
Colombo 05

Scope of Accreditation: Performing Chemical and Biological testing on Food and Agricultural Products and Potable water as per SLS and ISO methods.

The laboratory is accredited for the following tests.

Sl No.	Product(s) / Material of test	Specific tests performed	Test method / Standard against which tests are performed	Range of testing / Limits of detection
Biological Testing				
1.1	Food and Agricultural Products (Coconut Oil)	Enumeration of Yeast and Moulds	SLS 516 Part 02 section 02:2013 ISO 21527:2008	10 -10^5
1.2		Enumeration of microorganisms colony count technique at 30°c (Aerobic plate count)	SLS 516 Part 01 section 01:2013 ISO 4833:2013	10 -10^5
2.1	Food and Agricultural Products (Desiccated coconut, Coconut milk powder, Coconut water, Coir fibre pith substrate, Copra, Partially defatted desiccated coconut, Fresh coconut kernel)	Detection of *Salmonella sp.*	SLS 516 Part 05:2013 ISO 6579:2002	Present/Absent
2.2		Detection and enumeration of Coliforms	SLS 516 Part 03 section 01:2013 ISO 4831:2006	MPN 3 -1100
2.3		Detection and enumeration of *Escherichia Coli*	SLS 516 Part 12:2013 ISO 7251:2005	MPN 3 -1100
2.4		Enumeration of microorganisms colony count technique at 30°c (Aerobic plate count)	SLS 516 Part 01 section 01:2013 ISO 4833:2013	10 -10^5
2.5		Enumeration of Yeast and Moulds	SLS 516 Part 02 section 02:2013 ISO 21527:2008	10 -10^5
3.1	Potable Water	Detection and enumeration of *E. coli* & Coliform Bacteria	SLS 1461: Part 1: Section 3: 2013	MPN 0 - 1800

Page 01 of 02

Sl No.	Product(s) / Material of test	Specific tests performed	Test method / Standard against which tests are performed	Range of testing / Limits of detection
4.1	Food and Agricultural Products (Aqueous coconut products - Milk Cream & Paste)	Enumeration of Yeast and Moulds	SLS 516 Part 02 section 02:2013 ISO 21527:2008	10 -10^5
4.2		Detection of *Salmonella sp.*	SLS 516 Part 05:2013 ISO 6579:2002	Present/Absent
4.3		Detection and enumeration of Coliforms	SLS 516 Part 03 section 01:2013 ISO 4831:2006	MPN 3 -1100
4.4		Detection and enumeration of *Escherichia Coli*	SLS 516 Part 12:2013 ISO 7251:2005	MPN 3 -1100
Chemical Testing				
1.1	Food and Agricultural Products (Vegetable Oil)	Determination of saponification value	SLS 313: Part 2, Section 1: 2014 ISO 3657: 2013	150 – 300
1.2		Determination of Iodine value	SLS 313: Part 2, Section 2: 2014 ISO 3961: 2013	5 - 200
2.1		Determination of Free Fatty Acid (Acidity)	SLS 313: Part 2, Section 1: 2009 ISO 660: 2009	0.1 – 20.0
2.2	Potable Water /Drinking water/ Processing water	Chloride as Cl	APHA 4500 – Cl – B	1 – 400 (mg/L)
2.3		Total hardness as $CaCO_3$	APHA 2340 C	>1 mg/L
2.4		Calcium (as Ca)	APHA 3500 Ca A	0.8-200 mg/L
3.1		Magnesium	APHA 3500 Mg B	0.5-50 mg/L

Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment

රූපය 07 : SLAB සහතික පත

පොල් කිරි ආශ්‍රිත නිෂ්පාදන හා පොල් තෙල් වල ක්ෂුද්‍රජීවී පරාමිතීන් සඳහා ප්‍රතිතන තත්ත්වය ලබා ගැනීම සහ ජලයේ රසායනික පරාමිතීන් සඳහා 2019 වර්ෂයේ ආරම්භ කර ඇති අතර මේ සඳහා සුපරීක්ෂණ පරීක්ෂණයෙන් සමත්ව ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පිරිනමනු ලබන ISO 17025 ප්‍රතිතන තත්ත්වය 2023 ජුනි මස 29 දින දක්වා ලබා ගන්නා ලදි.

B පුහුණු වැඩසටහන් පැවැත්වීම

තත්ත්ව පාලන අංශයේ ආරම්භ කර ඇති ISO ප්‍රතිතන තත්ත්වයේ කටයුතු සඳහා සහ කාලීනව සංශෝධනය කර ඇති පොල් නිෂ්පාදන පරීක්ෂාකිරීමේ ක්‍රමවේද සඳහා අවශ්‍ය වන පුහුණුව රසායනාගාර සේවක පිරිස වෙනුවෙන් ලබාදී ඇති අතර වෙනත් බාහිර රසායනාගාරයන්හි සේවක පිරිස වෙනුවෙන් තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් පුහුණු වැඩසටහන් පවත්වා ඇත. වාර්ෂික සැලැස්මට අනුව පහත පරිදි ප්‍රගතිය ලබා ඇත.

	පුහුණු වැඩ සටහන	සහභාගි වූ සේවක සංඛ්‍යාව	පුහුණුව පැවැත්වූ ආයතනය
1	Consultant development training programme on Chemicals Management and Safety	01	National Cleaner Production Centre
2	Internal Auditing of Laboratory Management System as per ISO/IEC/17025:2017	02	Sri Lanka Accreditation Board
3	Awareness Programme – Introduction of GLP principles to Research & Development laboratories	01	Sri Lanka Accreditation Board
4	Online workshop on HACCP/ISO 22000 standard and implementation of FSMS	02	Sri Lanka Standards Institute
5	Online Awareness Programme on GLP	05	Sri Lanka Accreditation Board
6	Latest microbiological Testing Solution	01	Analytical Instruments Pvt. Ltd.,
7	SLAB Forum for inspection Bodies & Inspectors	03	Sri Lanka Accreditation Board
8	Ensuring Food safety with the contribution of NQI partners	03	Sri Lanka Accreditation Board

වගුව 17 : පුහුණු වැඩසටහන්

Q4 අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්වය සුරක්ෂිත කිරීම.

දිසිඳි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී හා භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම, කර්මාන්ත ශාලා පරීක්ෂාකිරීම සහ උපදේශක දායකත්වය සැපයීම. මේ යටතේ සිදුකරනු ලබන කාර්යයන් වේ.

2020 වර්ෂය තුල ක්ෂේත්‍ර පරීක්ෂා 134ක් පැවැත්වීමට හැකියාව ලැබී ඇත. නිෂ්පාදනකරුවන්ගේ ඉල්ලීම මත පරීක්ෂා කිරීම් වැඩිවී ඇති හෙයින් 2020 වසරේ ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 100%කි.

දිසිඳි පොල් නිෂ්පාදන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී පරීක්ෂා සිදුකිරීම 2019 වර්ෂය සඳහා ආදර්ශ 411ක් වන අතර 2020 වර්ෂය සඳහා ආදර්ශ 67කි. මෙම ආදර්ශ 67 හි සිදුකර ඇති සම්පූර්ණ පරීක්ෂණ සංඛ්‍යාව 201 කි. 2020 වසරේදි ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 100%කි.

තවද දිසිඳි පොල් නිෂ්පාදනයේදී භාවිතා කරනු ලබන ජලය නිසි ප්‍රමිතියෙහි පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා එම ජලයේ ක්ෂුද්‍රජීවී හා රසායනික විශ්ලේෂණය සිදුකරනු ලැබේ. මේ සඳහා ආදර්ශ 60ක් පරීක්ෂා කර ඇත. 2020 වසරේ වාර්ෂික ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 100%කි.

Q5 සැකසුම් සංවර්ධන අංශයේ ක්‍රියාකාරිත්වයට අදාලව පොල් නිෂ්පාදන විශ්ලේෂණය

සැකසුම් සංවර්ධන අංශයේ අවශ්‍යතාව පරිදි දෛනිකව පරීක්ෂා කිරීමේ පදනම මත නැවුම් පොල් තෙල් , පොල් තෙල් සහ කොහු බත් ආදර්ශ රැස්කොට ඇත. නැවුම් පොල් තෙල් ආදර්ශ 28ක් පරීක්ෂා කර ඇති අතර ප්‍රගතිය 56%කි. පොල් තෙල් ආදර්ශය 84ක් පරීක්ෂාකර ඇති අතර ප්‍රගතිය 84%කි. කොහු බත් උපස්ථර ආදර්ශ 191 පරීක්ෂා කර ඇති අතර අදර්ශ පරීක්ෂාවේ ප්‍රගතිය 80%කි. ඒ අනුව පොල් තෙල් ආදර්ශ 84 හි නිදහස් මේද අම්ල ප්‍රමාණය ප්‍රමිතිය හා එකඟ නොවීම මත 14% ක් ද, අයඩින් අගය එකඟ නොවීම මත 8% ක්ද වාර්තා වී ඇත.

දුන්කන්නාව රසායනාගාරයේ පවතින රසායනාගාර පහසුකම් යටතේ කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීම සිදුකර ඇති අතර ආදර්ශ 108 පරීක්ෂා කර ප්‍රගතිය 60%කි.

පොල් කිරි සහ පිටිකල පොල් ආදර්ශ 166 ක් පරීක්ෂාකර ඇති අතර ප්‍රගතිය 128%කි. කොප්පරා ආදර්ශ 03ක් පරීක්ෂා කර ඇති අතර, ප්‍රගතිය 6% කි. පොල් කටු අඟුරු ආදර්ශ 09ක් පරීක්ෂා කර ඇති අතර ප්‍රගතිය 38%කි.

වෙනත් බාහිර ක්‍රියාකාරම්

1. දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා දායකවීම

වැඩ සටහන	පැවැත්වූ ආයතනය/ ස්ථානය	දිනය
1. පොල් තෙල් නිෂ්පාදන ආයතන පරීක්ෂා කිරීම පිළිබඳ දිස්ත්‍රික් වැඩ මුළුව	මාතර	2020/06/26
	හම්බන්තොට	2020/06/26
	ගම්පහ	2020/07/03
	පුත්තලම	2020/07/03
	කුරුණෑගල	2020/07/13
	කළුතර	2020/07/17
	පුත්තලම	2020/08/13
2. Technology Transfer Workshop on Manufacturing & Quality Assurance of Virgin Coconut oil	Industrial Development Board of Ceylon	2020/08/20
3. යහපත් නිෂ්පාදන පුරුදු GMP සම්බන්ධව කොහු කෙඳි සහ කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තරුවන් දැනුවත් කිරීමේ වැඩ සටහන	පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, බණ්දිරිප්පුවත්ත, ලුණුවිල	2020/09/10

වගුව 18 : දැනුවත් කිරීමේ වැඩසටහන්

2. පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා එක්ව ප්‍රමිති සැකසීම හා පවතින ප්‍රමිතින් සංශෝධනය කිරීම.

3. සමස්ථ පොල් නිෂ්පාදන කර්මාන්තය සඳහා රෙගුලාසි සකස් කිරීමට දායකවීම.

4. පොල් සංවර්ධන අධිකාරියේ කාර්යයභාරය හා පොල් කර්මාන්ත සඳහා පොල් සංවර්ධන අධිකාරියේ මැදිහත් වීම පිළිබඳ හදුන්වාදීම සඳහා සිරස ආයතනය මඟින් ඉදිරිපත් කරනු ලබන ජීවිතයට ඉඩදෙන්න වැඩසටහනට 2020/07/09 දින ඉදිරිපත් වීම.

5. 2020/08/27 දින සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවති ප්‍රමිතිගත පොල් තෙල් සඳහා අධිකාරිය විසින් හදුන්වාදී ඇති ලාංඡනය එළිදැක්වීමේ මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩ සටහන සඳහා සහාගිවීම.

6. බි. සී. සී. ආයතනයේ පවතින RBD පද්ධතිය පිළිබඳ විමර්ශණය කිරීමේ කටයුතු සඳහා 2020/10/12 දින සහභාගි වීම.

තත්ත්ව පාලන අංශයේ සමස්ථ ප්‍රගතිය හා ආදායම ඉපැයීම

2020 වසර තුල සම්පුර්ණ ආදර්ශ 14,734ක් පරීක්ෂා කර ඇති අතර පරීක්ෂණ 59,793ක් සිදුකර ඇත. වාර්ෂික ඉපැයීම රු. මිලියන 17.53කි.

3. අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කාර්යභාරයක් ඉටුකරන අතර 2020 වසරේදීද පොල් සංවර්ධන අධිකාරිය මඟින් පොල් ක්ෂේත්‍රයේ අලෙවි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සකසන ලද සැලසුම් සාක්ෂාත් කරගැනීමට වර්ෂය පුරා අඛණ්ඩ දායකත්වයක් සපයන ලදී. එසේ ඉටු කරන ලද පහත දැක්වෙන ප්‍රධාන කාර්යභාරයන් පොල් සංවර්ධන ක්ෂේත්‍රයේ ඵලදායීතාව වැඩි කිරීම සඳහා දායක විය. මෙමඟින් 2020 වසර අවසන් වන විට සමස්ථ ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ අපනයන ආදායම කොවිඩ් උවදුර හමුවේ වුවද පුරෝකථනයන් අභිබවා වැඩි අගයක් ලඟා කර ගැනීමට හැකි විය. එය මෙතෙක් වාර්තාගත වැඩිම අපනයන ආදායම ලෙස රු .බිලියන 123 හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 661 දක්වා තව දුරටත් වර්ධනය කර ගැනීමට හැකි වීම පොල් ආශ්‍රිත අපනයන ක්ෂේත්‍රයේ සුවිශේෂී ජයග්‍රහණයකි. මෙහි දී අපගේ සේවාදායකයන් ඇතුළු පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන්ගේ අභිවෘද්ධිය සඳහා ඉවහල් වන වෙළඳපළ තොරතුරු සහ දත්ත , ගැණුම්කරුවන් , අලෙවිකරුවන් සොයා ගැනීම සඳහා අදාළ සේවාවන් සහ නව වෙළඳපළ නැඹුරුතාවයන් පිළිබඳ තොරතුරු හා අනෙකුත් සේවාවන් කාර්යක්ෂමවත් , ඵලදායි ලෙසත් සැපයීම සඳහා අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2020 වර්ෂයේ දීද සැළකිය යුතු කාර්යයභාරයක් ඉටු කරන ලදී.

2020 වර්ෂය තුළ ක්‍රියාත්මක සැලැස්මට අනුව ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- පොල් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා නව ජාත්‍යන්තර වෙළඳපළ සහ ගැණුම්කරුවන් හඳුනාගැනීම මඟින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කර ගැනීමේ අරමුණින් පොල් කෙඳි හා වගා මාධ්‍ය පිළිබඳව ජර්මනියේ එසෙන්ස්හි පැවති IPM ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන්ට / නිෂ්පාදකයින්ට අනුග්‍රාහකත්වය ලබාදෙමින් ඔවුන් සමඟ පොල් සංවර්ධන අධිකාරිය අලෙවි ප්‍රවර්ධන වැඩසටහනකට සහභාගී වූ අතර මෙහිදි ජාත්‍යන්තර වෙළඳපළට පොල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම සඳහා නව ඉඩ ප්‍රස්ථා හඳුනා ගැනීමේ අරමුණින් B2B සාකච්ඡා වාර පැවැත්වීමද සිදු කරන ලදි.
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම සහ පහසුකම් සැලසීම - අපනයනකරුවන්, වෙළඳුන්, පොල් වතු හා අතරමැදියන් ලියාපදිංචි කිරීම
- පොල් හා තැඹිලි අපනයනය උසස් ප්‍රමිතියකින් ජාත්‍යන්තර වෙළඳපල අවශ්‍යතාවන්ට ගැළපෙන ලෙස ඉටුකිරීම සඳහා අදාළ අවසරපත් නිකුත් කිරීම සහ ක්ෂේත්‍රයට පිවිසීමට අපේක්ෂා කරන අපනයන ප්‍රමුඛ ව්‍යවසායකයින් සඳහා තාවකාලික අපනයනයන් සඳහා අවසරපත් නිකුත් කිරීම
- පොල් ආශ්‍රිත අපනයන හා ආනයන අධීක්ෂණ කටයුතු
- වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම
- ගෙඩි පොල් හා කොප්පරා වෙන්දේසි පැවැත්වීම
- දිනපතා පොල් හා පොල් ආශ්‍රිත වෙළඳපළ මිල ගණන් මුද්‍රිත මාධ්‍ය වෙත ලබාදීම
- පොල් ආශ්‍රිත නිෂ්පාදන, අපනයන / ආනයන ප්‍රමාණ, වෙන්දේසි මිල ගණන්, ලෝක වෙළඳපලේ පොල් ආශ්‍රිත මිල ගණන් ඇතුළත් සති වාර්තා, මාසික වාර්තා සහ 2019 වසර සඳහා ශ්‍රී ලංකා පොල් සංඛ්‍යාති වාර්තාව නිකුත් කිරීම.
- දේශීය අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවීමෙන් පොල් ආශ්‍රිත කර්මාන්ත හා ඒවායේ වැදගත්කම පිළිබඳව මහජනතාව හා පාසැල් සිසුන් දැනුවත් කිරීම.
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, පාරිභෝගික සේවා අධිකාරිය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ වෙළඳ ගිවිසුම් හා බැඳි සාකච්ඡා වටයන්ට සහභාගි වීම හා අවශ්‍ය තොරතුරු ලබා දීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් සඳහා විදේශීය වෙළඳ විමසුම් ලබාදීම.
- ගෙඩි පොල් සඳහා ආදේශකයක් වන පොල් කිරි හා පොල් කිරි පිටි භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා සජීවීකාරක (Demonstrations) වැඩසටහන් සහ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන්හි වැඩසටහන් පැවැත්වීම
- දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයන් හඳුනාගැනීම සඳහා අලෙවි සමීක්ෂණ පැවැත්වීම

2020 වසර තුළ අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා සේවාවන් සහ ඉන් ලබා ගත් ප්‍රගතිය පහත දැක්වේ.

3.1 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම





පොල් සංවර්ධන අධිකාරිය විසින් සෑම වසරකම තෝරා ගත් විදේශීය වෙළඳ ප්‍රදර්ශන කීපයකට අපනයනකරුවන් සහභාගී කරවීම තුළින් අගය එකතු කරන ලද පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වැඩි විදේශ විනිමයක් උපයා ගැනීමට හැකියාව ලැබී ඇත. මෙසේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වීමෙන් විදේශ ඇණවුම් වැඩි වශයෙන් ලබාගැනීමටත්, තරඟකාරී භාණ්ඩයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත්, දිනෙන් දින යාවත්කාලීන වන භාණ්ඩයන්ගේ ප්‍රමිතීන් පිළිබඳව දැනුවත් වීමටත් හැකියාව ලැබේ. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා නිෂ්පාදන/අපනයනකරුවන් සහභාගී කරවීමෙන් ශ්‍රී ලංකාව සඳහා වූ විදේශ වෙළඳපළ තව දුරටත් පුළුල් වන අතර පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසරින් වසර ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇති ඇත. එමඟින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ලැබේ. එම රටවල තානාපති කාර්යාල හා සම්බන්ධ වෙමින් ශ්‍රී ලාංකික පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා නව ගැණුම්කරුවන් හඳුනා ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය ක්‍රියා කරන ලදී.



ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් / නිෂ්පාදකයින් සමඟ සහභාගි වීමෙන් විදේශීය ඇණවුම් ව ගැනීමට අවස්ථාව උදාවන අතර පවතින වෙළඳපළ ආරක්ෂා කර ගැනීමටත්, නව ගැණුම්කරුවන් හඳුනා ගැනීමටත්, විදේශීය රටවල භාවිතා කරන හා ඉදිරි වෙළඳපළ අත්පත් කර ගන්නා තරඟකාරී භාණ්ඩයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත්, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ජාත්‍යන්තර ප්‍රජාව බලාපොරොත්තු වන මට්ටමේ නිෂ්පාදන සහ ඒවායේ ප්‍රමිතිය මෙන්ම ගුණාත්මකභාවය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් හැකියාව ලැබේ. මෙසේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගි කරවීමේදී ලබා ගන්නා නව ඇණවුම් මඟින් මෙන්ම පවතින ඇණවුම් සම්බන්ධයෙන් විදේශීය ගැණුම්කරුවන් සමඟ විශ්වාසය තහවුරු කරගැනීම මඟින්ද පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කර ගැනීමට අවස්ථාව උදාවී ඇත.





රූපය 08 : ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම

රූපය 08 : ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම

2020 වස
බැවින් මෙම වසරේ ජනවාරී මස පොල් සංවර්ධන අධිකාරිය උද්‍යාන සහ ගෙවතු අලංකරණය සඳහා වන ජර්මනියේ එසෙන්ස්හි පැවැත්වූ “IPM – 2020” ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට පමණක් සහභාගී වූ අතර එම ප්‍රදර්ශනය සඳහා අපනයන ආයතන හයක් (06) සහභාගී

පොල් කෙඳි ආශ්‍රිත අගය වැඩිකළ නිෂ්පාදනයන් වශයෙන් සැලකෙන වගාමළු, කොහු මල් පෝච්චි,

මිහිසළු, ඩිස්ක්, කොහු බත් කැට යන නිෂ්පාදන ඉලක්ක කර ගනිමින් මෙම ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන් සහභාගී වූ අතර එම ප්‍රදර්ශනයේදී ලබාගත් ඇණවුම් දැනටමත් අපනයනය කර ඇති අතර තවදුරටත් ඇණවුම් සඳහා අදාළ ද්විපාර්ශවික සාකච්ඡා සිදුකරමින් පවතින බව සහභාගි වූ අපනයනකරුවන් විසින් පොල් සංවර්ධන අධිකාරිය වෙත වාර්තා කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීමේ කාර්යයන් ඉටු කිරීමට අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් ක්‍රියා කරනු ලැබේ. එම ප්‍රදර්ශනයේදී අපනයනකරුවන් හට ප්‍රධාන වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය, ඉතාලිය, ජර්මනිය, කැනඩාව, ඊශ්‍රායලය, නෙදර්ලන්තය, ජපානය, ප්‍රංශය, ස්පාඤ්ඤය සහ දකුණු කොරියාව වැනි රටවලින් ඇණවුම් ලැබී තිබූ අතර තව දුරටත් ඇණවුම් ලැබීමට නියමිත බව අපනයන කරුවන් විසින් දන්වා ඇත.

3.2 පොල් හා පොල් ආශ්‍රිත නිමි භාණ්ඩ අලෙවිකරණ සම්බන්ධ සියලු පාර්ශවයන් හා පොල් වතු ලියාපදිංචිය

2019 වසරට සාපේක්ෂව 2020 වසරේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ක්ෂේත්‍රයෙහි නියැලෙන අපනයනකරුවන්ගේ ලියාපදිංචිය 5%කින් ඉහළ යාමක් පෙන්නුම් කර ඇත.

ලියාපදිංචි කටයුතු - 2019/2020

ලියාපදිංචි කිරීම්	2019	2020
අපනයන කරුවන්	614	643
බ්‍රෝකර්වරුන්	15	20
වෙළඳුන්	47	74
පොල් වතු	254	246

වගුව 19 : ලියාපදිංචි කටයුතු

3.3 පොල් හා කොප්පරා වෙන්දේසි පැවැත්වීම

3.3.1 කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

පොල් වගාකරුවා හා ගැණුම්කරුවා යන දෙපාර්ශවයටම අවාසියක් නොවන ආකාරයට 1994 වසරේ සිට පුරා වසර 26ක් මෙහෙයවනු ලැබූ ගෙඩි පොල් වෙන්දේසිය 2020 වසරේදීද පවත්වන ලද අතර, ඒ යටතේ 2020 වසරේදී කොළඹ පොල් වෙන්දේසි 37ක් පැවැත්වීමට අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයට හැකි විය. කොවිඩ් වසංගත තත්ත්වය තුළද ZOOM තාක්ෂණය උපයෝගී කරගනිමින් පොල් වෙන්දේසිය පවත්වන ලදී.

වර්ෂය	ගෙඩි ප්‍රමාණය		සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට)
	ඉදිරිපත් කළ ප්‍රමාණය	විකුණූ ප්‍රමාණය	
2019	113,294,492	40,321,738	27,549.69
2020	34,886,660	25,464,460	48,891.47

වගුව 20: කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

2019 වසරට සාපේක්ෂව 2020 වසරේ පොල් එලදාවේ 10%ක පමණ අඩුවීමක් තිබුණි. එබැවින්, වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ පොල් ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබුණු අතර වෙන්දේසියේදී පොල් මිලදී ගත් සාමාන්‍ය මිල 77%කින් පමණ ඉහළ ගොස් තිබුණි.

3.3.2 ප්‍රාදේශීය ගෙඩි පොල් වෙන්දේසිය

කුලියාපිටිය ප්‍රාදේශීය පොල් වෙන්දේසිය 2020 වසරේදීද අවස්ථා 07කදී පමණක් පවත්වන ලද අතර කුඩා හා මධ්‍යම පරිමාණයේ පොල් වගාකරුවන්ට ඔවුන්ගේ පොල් තොග සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට හැකිවන පරිදි වෙන්දේසිය ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ පිලිබඳ දත්තයන් පහත දැක්වේ;

වර්ෂය	ගෙඩි ප්‍රමාණය		සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට)
	ඉදිරිපත් කළ ප්‍රමාණය	විකුණූ ප්‍රමාණය	
2019	2,266,284	1,304,150	30,264 [රු. 47.75/කි.ග්‍රෑ.]
2020	833,236	370,026	48,774 [රු. 79.00-93.00/කි.ග්‍රෑ.]

වගුව 21 : ප්‍රාදේශීය ගෙඩි පොල් වෙන්දේසිය

3.3.3 කොප්පරා වෙන්දේසිය

2020 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් කොප්පරා වෙන්දේසි 06 ක් පවත්වන ලද අතර ඒ පිළිබඳ දත්තයන් පහත දැක්වේ;

වර්ෂය	ඉදිරිපත් කළ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	විකුණූ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	සාමාන්‍ය මිල ගණන් (රු. කි.ග්‍රෑ 250 පාරමක් සඳහා)	
			විශිෂ්ඨ අංක 1	විශිෂ්ඨ අංක 2 සහ 3
2019	86,133	68,446	41,121	39,547
2020	35,980	35,980	57,896	57,500

වගුව 22 : කොප්පරා වෙන්දේසිය

3.3.4 වෙළඳ ආරවුල් සම්බන්ධ කටයුතු

පොල් වෙන්දේසියේදී හා කොප්පරා වෙන්දේසියේදී අලෙවිකරුවන් හා ගැණුම්කරුවන් අතර ඇතිවන වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහා මැදිහත්කරු ලෙස 2020 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සුවිශේෂි කාර්යය භාරයක් ඉටු කළ අතර පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය හා ප්‍රශ්ණකාරී තත්ත්වයන් යටතේ අපනයනය කරන ලද බහාලුම් නැවත ආනයනය කරන අවස්ථාවන්හිදී ඇති වූ වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම සඳහා ද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සිය දායකත්වය ලබා දෙන ලදී.

3.4 පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් අලෙවි ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම

3.4.1 දේශීය වෙළඳ ප්‍රදර්ශන

පොල් ආශ්‍රිත භාණ්ඩ දේශීයව ප්‍රවර්ධනය කිරීම තුළින් එහි විවිධාංගීකරණය, ගුණාත්මකභාවය, විවිධ අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගන්නා ආකාරය, මිල ගණන් උච්චාවචනය වන ආකාරය, ජාතික ආර්ථිකයට සහ ශ්‍රී ලාංකීය ජන සමාජයට මෙම ක්ෂේත්‍රයේ ඇති වැදගත්කම පිළිබඳවත්, පොල් සංවර්ධන අධිකාරියේ කාර්යයභාරයන් සහ සේවාවන් පිළිබඳවත් මහජනතාව හා පාසැල් සිසුන් දැනුවත් කිරීම අරමුණු කරගනිමින් දිවයින පුරා පැවති වෙළඳ, කෘෂිකර්ම හා අධ්‍යාපන ප්‍රදර්ශන 03 කට 2020 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගි වූ අතර එහිදී ප්‍රදර්ශන නැරඹීමට පැමිණි මහජනතාව හා පාසැල් සිසුන් වෙනුවෙන් පොල් ආශ්‍රිත කර්මාන්ත, දේශීය හා විදේශීය වෙළඳපළ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී.





රූපය 09 : ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම

2020 වසරේ පැවති කොවිඩ් උවදුර තත්ත්වය හේතුවෙන් වෙනත් වර්ෂයන්හී මෙන් දේශීය ප්‍රදර්ශනද සංවිධානය නොකිරීම නිසා දේශීය ප්‍රදර්ශන අඩු සංඛ්‍යාවකට සහභාගී විය.
පහත දැක්වෙන දේශීය ප්‍රදර්ශන සඳහා අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගි විය;

ප්‍රදර්ශනයේ නම	ස්ථානය	සංවිධානය
යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය	යාපනය මහා නගර සභා ක්‍රීඩාංගණය	ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන සේවා පුද්ගලික සමාගම සහ යාපනය දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
Technocrat 2020 අධ්‍යාපනික ප්‍රදර්ශනය	පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය	පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය තාක්ෂණ අධ්‍යයන අංශය
ජාත්‍යන්තර පොල් සතියේ සමාප්ති වැඩසටහන	පොළොන්නරුව පොල් පැළ තවාන	පොල් වගාකිරීමේ මණ්ඩලය

වගුව 23 : ප්‍රදර්ශන

3.4.2 ප්‍රදර්ශනාත්මක වැඩසටහන් (Demonstrations) පැවැත්වීම

2020 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් පොල් පරිභෝජනයේදී සිදුවන නාස්තිය අවම කිරීමේ අරමුණෙන් පොල් කිරි සහ පොල් කිරි පිටි නිෂ්පාදන මහජනතාව අතර ප්‍රචලිත කිරීම අරමුණු කොට එම නිෂ්පාදන භාවිතයෙන් රසවත් ලෙස ආහාර සකසා ගන්නා ආකාරය සහ පොල් නාස්තිය අවම කිරීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රදර්ශනාත්මක වැඩසටහන් (Demonstrations) 2ක්, පෞද්ගලික ව්‍යවසායකයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

3.5 දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයන් හඳුනාගැනීම සඳහා අලෙවි සමීක්ෂණ පැවැත්වීම

පර්යේෂණ කටයුතු - 2020

- ශ්‍රී ලංකාවේ දිසිඳි පොල් සඳහා අපනයන වෙළඳපොල ,වර්තමාන වෙළඳපොලේ තත්ත්වය, ජාත්‍යන්තර වෙළඳපල සංවර්ධනය සඳහා පවතින අපනයන බාධක හඳුනාගැනීම
- පශ්චාත් COVID ආර්ථික ප්‍රතිසාධනය : අභියෝග සහ අවස්ථාවන් - පොල් නිෂ්පාදන මත පදනම් වූ අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් සඳහා වන බලපෑම

පොල් කර්මාන්තයට අදාල ශක්‍යතා අධ්‍යයන (feasibility studies)

- SCL (විශේෂ වෙළඳ බද්ද) වෙනස්වීම් වල බලපෑම
- අගය එකතු කරන සක්‍රීය කාබන් කර්මාන්තය තුළ පවතින අමුද්‍රව්‍ය හිඟය සඳහා පොල් කටු අඟුරු අපනයනය සීමා කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය
- පොල් ලෙල්ල මත පදනම් වූ උපස්ථර නිෂ්පාදන සහ පොල් කෙඳි පදනම් කරගත් නිෂ්පාදන නව ජාත්‍යන්තර වෙළඳපොළට ව්‍යාප්ත කිරීමේ හැකියාව
- පාම් තෙල් ආනයනය කිරීම
- විචල්‍ය විශ්ලේෂණය (පොල් නිෂ්පාදනය, පොල් මද අපනයනය සහ භූමි ප්‍රමාණය අතර සහ සම්බන්ධය)

3.6 පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ නිෂ්පාදනයන්, වෙළඳාම සහ අපනයන පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම

පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්තකරුවන්ට මෙන්ම අපනයනකරුවන්ට සිය නිෂ්පාදන සඳහා මිල ගණන් තීරණය කිරීමේදී අදාළ නිවැරදි වෙළඳපළ තොරතුරු හා දත්ත ලබා ගෙන නිවැරදි විශ්ලේෂණයක් තුළින් සිය කර්මාන්ත හා වෙළඳ රටාව තීරණය කිරීම සඳහාත්, ඔවුන්ගේ තීරණ ගැනීමේ හැකියාව පහසු කරලීම සඳහාත් පහත දක්වා ඇති ක්‍රියාවලීන් 2020 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ තොරතුරු සේවාව මගින් ඉටුකරන ලදී;

- පොල් ආශ්‍රිත කර්මාන්තයන්ගේ නිෂ්පාදන තොරතුරු, අපනයන සහ ආනයන තොරතුරු හා දත්ත රැස් කිරීම සහ එම තොරතුරු හා දත්ත අවශ්‍ය පාර්ශව වෙත අවශ්‍ය අවස්ථා වලදි ලබාදීම.
- පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් දෛනිකව ලබා ගෙන ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍ය දිනපතා මුද්‍රිත මාධ්‍යයන් මගින් ප්‍රකාශයට පත් කිරීම.
- 2020 වසරේදීද පොල් හා කොප්පරා වෙන්දේසි මිල ගණන්, දේශීය පොල් ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ගොවිපළ මිල ගණන්, තොග මිල ගණන් හා ජාත්‍යන්තර මිල ගණන් ඇතුළත් කොට සති පතා නිකුත් කරනු ලබන "Coco Market Focus" සති වාර්තා ප්‍රකාශන 40 ක් ප්‍රකාශයට පත් කරනු ලැබීම.



- ප්‍රකාශන 12 කින් සමන්විත "Coco Market Focus" මාසික සඟරාව 2020 වසර තුළදීද ප්‍රකාශයට පත් කිරීම.
  සියලුම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ අපනයන ප්‍රමාණයන්, මිල ගණන්, අපනයනය කරන ලබනු රටවල් සහ ආනයනය කරනු ලබන බාද්‍ය තෙල්, පොල් තෙල්, සක්‍රීය කාබන් ආදී නිෂ්පාදනයන්හී ආනයන ප්‍රමාණයන් හා මිල ගණන් ඒවායේ ඇතුළත් වූ අතර, පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ හා අපනයන ක්ෂේත්‍රයේ නියැලි පාර්ශවකරුවන් සඳහා මෙම ප්‍රකාශය සිය වෙළඳ තීරණ ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් ප්‍රකාශයට පත් කරන Sri Lanka Coconut Statistics – 2019 ප්‍රකාශනය 2020 වසරේදී නිකුත් කළ අතර මෙය දේශීයව සහ ජාත්‍යන්තරව ඉහළ ඉල්ලුමක් ඇති පොල් කර්මාන්තය හා අපනයන ක්ෂේත්‍රයේ දත්ත, තොරතුරු හා විස්තර ඇතුළත් පරිපූර්ණ වාර්ෂික ප්‍රකාශනයකි. මෙම ප්‍රකාශනය පොල් හා ඒ ආශ්‍රිත සියලුම අපනයන හා ආනයන ආශ්‍රිත මිල ගණන්, අපනයනය කරනු ලබන රටවල්, ලාංකීය පොල් එලදාව, ජාත්‍යන්තර පොල් ප්‍රජාව නියෝජනය කරනු ලබන රටවල්හී පොල් එලදා දත්ත, නිෂ්පාදන හා අපනයන තොරතුරු, පොල් වෙන්දේසිය හා සම්බන්ධ පාර්ශවකරුවන්ගේ හා අපනයනකරුවන්ගේද තොරතුරු වලින් සමන්විත වේ.



රූපය 10 : සඟරා

- වර්තමාන හා අපේක්ෂිත පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳ තොරතුරු විධිමත්ව රැස්කිරීම, වගුගත කිරීම හා ප්‍රචාරය කිරීම
- දේශීය හා විදේශීය වශයෙන් පොල් සහ ඒ ආශ්‍රිත කර්මාන්ත ආශ්‍රිතව ප්‍රතිපත්තීන් සැකසීමට දායක කර ගැනීම සඳහා පහත සඳහන් ආයතන වෙත අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2020 වසරේදීද දත්ත ලබා දීම සිදු කරන ලදී.
  - ශ්‍රී ලංකා මහ බැංකුව
  - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
  - අපනයන සංවර්ධන මණ්ඩලය
  - විවිධ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන
  - එමෙන්ම, ජාත්‍යන්තර පොල් ප්‍රජාව, විදේශ සඟරා (Cocommunity, Oil World, UCAP, Indian Coconut Journal) ආදී විදේශීය ආයතන හා සම්බන්ධ වෙමින් ලබා ගන්නා තොරතුරු හා දත්ත නිරන්තරයෙන් ලාංකීය පොල් ප්‍රජාවට ලබා දීමෙන් විශේෂ කාර්යභාරයක් 2020 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් ඉටු කරන ලදී.

3.7 පොල් කර්මාන්තයේ අපනයන ආදායම

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හී පසුගිය වසර 11ක අපනයන ආදායම (2010 - 2020) පහත දක්වා ඇත.

වසර	වටිනාකම	
	(රු. මිලියන)	(ඇ. ඩො. මිලියන)
2010	32,433	286.86
2011	47,306	427.85
2012	46,667	365.72
2013	47,952	371.40
2014	72,880	558.21
2015	75,259	553.63
2016	84,702	581.74
2017	91,198	598.19
2018	94,722	583.81
2019	108,946	609.77
2020	122,514	661.04

වගුව 24 : අපනයන ආදායම



ප්‍රස්තාරය 8: පොල් නිෂ්පාදිත අපනයන ආදායම 2010 - 2020

මෙතෙක් වාර්තාගත ඉහළම අපනයන ආදායමවූ ඇ.ඩො. මිලියන 661 ක් ලබාගැනීමට 2020 වසරේදී හැකිවූ අතර, එය 2019 වසරට සාපේක්ෂව 8% ක වර්ධනයකි.

2020 වසරේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතයන්හී අපනයන ආදායම ඇ.ඩො. 12% ක වර්ධනයක් පෙන්වූ අතර, පොල් කටු ආශ්‍රිත නිෂ්පාදිතයන්හී අපනයන ආදායම ඇ.ඩො 4% ක වර්ධනයක් ද අමුද්‍රව්‍ය ස්වරූපයේ කොහු අපනයනයන්හී ආදායමේ ඇ.ඩො 8% ක වර්ධනයක්ද, අගය එකතු කල කොහු නිෂ්පාදන අපනයනයන්හී ආදායම ඇ.ඩො.4%ක වර්ධනයක්ද පෙන්නුම් කළ අතර, 2021 වසරේ පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයෙහි අපනයන ආදායම ඇ.ඩො. මිලියන 700ක් ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3.8 නව නිෂ්පාදන, අගය එකතු කිරීම්, වෙළඳපල ප්‍රවර්ධනය, සහ වෙළඳපල ප්‍රවිෂ්ඨය ඉහළ නැංවීම

3.8.1 2019 වසරේදීද නව ගැණුම්කරුවන් හඳුනා ගැනීම හේතුවෙන් 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ පොල් තෙල්, නැවුම් පොල් තෙල් , පොල් කිරම, පොල් පිටි, පොල් චතුර, පොල් කිරිපිටි සහ පොල් බටර් අපනයනයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

3.8.2 පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය (www.cda.gov.lk) මඟින් වඩාත් විධිමත් ලෙස දත්ත හුවමාරු කර ගැනීමේ කටයුතු 2020 වසරේදීද සිදු කරන ලදී.

3.8.3 අගය එකතු කළ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන හා පරිසර හිතකාමී පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රවර්ධන සේවාවන් 2020 වසරේදීද සිදු කරන ලදී.

3.9 අලෙවි සංවර්ධන සහාය සේවා

- නිෂ්පාදන / වෙළඳපොළවල් හා විවිධ සේවාවන් පිළිබඳව උපදේශක සේවාවන් ලබාදීම, දේශීය හා ජාත්‍යන්තර වෙළඳ ඇණවුම් පිළිබඳ තොරතුරු කර්මාන්තකරුවන්ට / අපනයනකරුවන්ට / ගැණුම්කරුවන්ට ලබා දීම.
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදනයන් සඳහා පුරෝකථනයන් සැකසීම, වෙළඳ ප්‍රතිපත්ති සැකසීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහාය වීම.

පොල් නිෂ්පාදිත අපනයන - 2019 /2020

සංසන්දනාත්මක සංඛ්‍යාලේඛන

නිෂ්පාදන වර්ගය	ප්‍රමාණය (මෙ.ටො.)			වටිනාකම (ඇ.ඩො.000.)		
	2019	2020	% වෙනස	2019	2020	% වෙනස
1. පොල් මද නිෂ්පාදිතයන්						
1) පොල් තෙල්	4,056	5,180	28	10,647	14,231	34
2) නැවුම් පොල්තෙල්	12,344	14,584	18	50,185	64,435	28
3) දිසිඳි පොල්	49,667	29,591	-40	86,710	76,207	-12
4) කොප්පරා	3,915	1,082	-72	5,189	1,620	-69
5) ගෙඩි පොල්ගෙඩි (000)	21,426	15,838	-26	8,260	6,633	-20
6) තැඹිලි (ගෙඩි)	6,490,963	5,924,087	-9	3,900	3,235	-17
7) පුන්නක්කු	26,425	8,935	-66	7,101	2,343	-67
8) ඔයිල් කේක්	3,286	3,340	2	1,207	1,183	-2
9) පොල් කිරම	10,987	15,048	37	23,369	33,116	42
10) පොල් කිරි	36,396	46,626	28	61,670	83,111	35
11) පොල් කිරිපිටි	7,448	6,751	-9	30,631	31,277	2
12) මේදය ඉවත් කළ පොල්	2,906	3,303	14	3,122	3,961	27
13) පොල් වතුර	10,851	17,910	65	8,975	15,028	67
14) පොල් අරක්කු (ලීටර්)	18,499	13,325	-28	117	128	10
15) විනාකිරි (ලීටර්)	25,294	42,691	69	77	175	127
16) ෆැටි ඇසිඩ්	108	268	148	70	200	188
17) පොල් බටර්	82	127	55	312	468	50
18) පොල් පිටි	1,962	3,630	85	2,345	4,219	80
උප එකතුව -පොල් මද නිෂ්පාදිතයන්				**303,887**	**341,572**	**12**
2. කෙඳි නිෂ්පාදිතයන්						
19) ගුදිරි කෙඳි	51,888	71,604	38	13,062	17,328	33
20) බ්‍රිස්ටල් කෙඳි	1,433	1,231	-14	2,305	1,738	-25
21) අඹරන ලද කෙඳි	33,550	30,733	-8	11,229	9,555	-15
උප එකතුව -කෙඳි නිෂ්පාදිතයන්	**86,871**	**103,568**	**19**	**26,595**	**28,621**	**8**
3. පොල් කටු නිෂ්පාදිතයන්						
22) පොල් කටු අඟුරු	11,609	12,038	4	5,410	5,848	8
23) පොල් කටු කැබලි හා කුඩු	317	319	1	151	148	-3
24) සක්‍රීය කාබන්	42,373	45,306	7	101,483	105,514	4
උප එකතුව -පොල් කටු නිෂ්පාදිතයන්	**54,299**	**57,663**	**6**	**107,044**	**111,509**	**4**
4. නිමි භාණ්ඩ නිෂ්පාදි (කොහු කෙඳි ආශ්‍රිත)						
25) කොහු ලණු	1,181	992	-16	1,138	822	-28
26) කොහු කඹ	8,297	7,268	-12	10,474	9,597	-9
	ඇක්ටිවේටඩ් කාබන් නිපැයුම්කරුවන් ලියාපදිංචිය			31,000	
	බහුවිධ පොල් නිපැයුම් බෙදාහරින්නන් ලියාපදිංචිය			138,560	1,642,340
16	උපචිත වියදම්				රු
	ජී බී ඕ				
	ගෙවිය යුතු සේ නි හා අ අරමුදල් දායකත්ව			254,903	
	ගෙවිය යුතු සේ අ අරමුදල් දායකත්ව			1,958,903	
	පුවත්පත්			57,520	
	ගෙවිය යුතු කාසි			968	
	ජලය			43,249	
	විදුලි සංදේශ			99,487	
	දේශීය ගමන් වියදම්			194,511	
	විදුලි වියදම්			304,842	
	මුද්දර ගාස්තු			1,786,813	
	ගෙවිය යුතු EST			367,224	
	වැටුප්			181,363	
	ඉන්ධන සහ ලිහිසි තෙල්			246,625	
	ප්‍රවාහන			65,950	
	ආරක්ෂක සේවා			348,300	
	පවිත්‍රතා සේවා			276,510	
	අතිකාල			741,708	
	විගණන ගාස්තු			684,528	
	අලුත්වැඩියා සහ නඩත්තු			2,177,967	9,791,370
17	ප්‍රාග්ධන සංවර්ධන ප්‍රදාන				රු
	2020.12.31.දිනට ශේෂය				77,652,767

18	<u>වියදමට සාපේක්ෂව සමුච්චිත ආදායම</u>				
	<u>ජී බී ඕ</u>				-
	2020.01.01. දිනට ශේෂය				298,433,586
	පෙර වසරේ ගැලපුම්				(25,997,124)
	අතිරික්තය/ හිඟය				80,563,280
	2020.12.31 දිනට ශේෂය				352,999,742
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදල				
	2020.01.01. දිනට ශේෂය				73,139,490
	අතිරික්තය/ හිඟය 2020				7,352,560
	ගැලපුම්				5,783,404
	2020.12.31 දිනට ශේෂය				86,275,454
	පී එස් එස් තෙල් අරමුදල				
	2020.01.01 දිනට සමුච්චිත අරමුදල				396,889,485
	පෙර වසරේ ගැලපුම්				2,854,103
	අතිරික්තය/ හිඟය 2019				(75,696,789)
	2020.12.31 දිනට සමුච්චිත අරමුදල				324,046,799
	එන් ආර් අයි අරමුදල				
	2020.01.01. දිනට ශේෂය				154,893
	පොලිය				9,367
	2020.12.31 දිනට ජී බී ඕ වෙත මාරු කරන ලද ශේෂය				164,259
					රු
	<u>එම් ඩී එෆ්</u>		<u>ජය ඉසුර අරමුදල</u>	<u>මෝල</u>	<u>එකතුව</u>
			<u>රු</u>	<u>රු</u>	
	ඉතුරුම් ගිණුම	පිටුව-27		31,625,386	
	අක්‍රිය එම් ඩී එෆ් ගිනුම			1,871,776	
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදලෙන් ලැබිය යුතු			7,029,942	
	ජය ඉසුර ණය ප්‍රදාණයන්		114,428,614		
	ඉතුරුම් ගිනුම		13,662,102	-	
	පී එස් එස් තෙල් අරමුදලට ගෙවිය යුතු (ණය)		(76,277,972)	-	
	ජී බී ඕ තෙල් අරමුදලට ගෙවිය යුතු (ණය)		(23,000,000)	-	
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදල		688,597	-	
	TB ලැබිය යුතු පොලී		-	-	
	2020.01.01. දිනට ශේෂය		29,501,342	40,527,104	70,028,446
	ඉතුරුම් ගිණුම	පිටුව -27		42,635,412	
	අක්‍රිය එම් ඩී එෆ් ගිනුම			1,871,776	
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදලෙන් ලැබිය යුතු			1,692,283	
	ජය ඉසුර ණය ප්‍රදාණයන්		116,807,768	-	
	ඉතුරුම් ගිනුම		14,417,202	-	

	ස්ථාවර තැන්පතු		103,783,342		
	පී එස් එස් තෙල් අරමුදලට ගෙවිය යුතු (ණය)		(76,277,972)	-	
	ජී බී ඕ තෙල් අරමුදලට ගෙවිය යුතු (ණය)		(123,000,000)		
	ලැබිය යුතු පොලී		1,588,277		
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදල		688,597	-	
	2020.12.31 දිනට ශේෂය		38,007,216	46,199,471	84,206,687
			8,505,874	5,672,367	
	<u>පී එස් එස් තෙල් අරමුදල</u>				
	එම් ඩී එෆ් ජංගම ගිණුම				76,277,972

අනාවරණයන්

රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාර අරමුදලෙහි ආයෝජනය කරන ලද රු T.93,228,581.82 (උපචිත පොලියද සමග) අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ මෙම අරමුදල නතර කිරීමෙන් පසුව මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලදී.

<u>නීති කෘත්‍යයන්</u>

පොල් සංවර්ධන අධිකාරියට එරෙහිව එහි සේවකයකු විසින් මානව හිමිකම් නඩුවක් ගොනු කරන ලදී. මෙය උපරිමාධිකරණයෙහි විභාග වෙමින් පවත්නා නඩුවකි.

පොල් සංවර්ධන අධිකාරිය

2020.12.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට සටහන්

1	පොළී ආදායම			රු
	ජී බී ඕ			
	කාර්ය මණ්ඩල ණය පොලී		1,025,849	
	ආයෝජන මත පොලී (භාණ්ඩාගාර බිල්පත්)		161,400	
	ස්ථාවර තැන්පතු මත පොලී		25,826,551	27,013,800
	ප්‍රාග්ධන සංවර්ධන අමුදල			
	ස්ථාවර තැන්පතු මත පොලී		3,462,254	
				3,462,254
	පී එස් එස් තෙල් අරමුදල			
	භාණ්ඩාගාර බිල්පත් මත පොලී		3,062,103	
	බැංකු ණය මත පොලී		110,285	
	ස්ථාවර තැන්පතු මත පොලී		13,944,067	
	ඉතුරුම් ගිනුම් මත පොලී		415,347	17,531,802
	එම් ඩී එෆ් අරමුදල			
	ස්ථාවර තැන්පතු මත පොලී		2,840,724	
	බැංකු ණය මත පොලී		2,782,697	
	ඉතුරුම් ගිනුම් මත පොලී		351,557	5,974,978
2	කුලී ආදායම			
	ඉසුරු සල ජී බී ඕ			168,000
3	ලියාපදිංචි ගාස්තු			
	ජී බී ඕ		-	-
	මහා පරිමාණ පොල් මද නිපැයුම් අපනයනකරුවෝ		2,742,712	-
	සුළු පරිමාණ පොල් මද නිපැයුම් අපනයනකරුවෝ		4,699,810	-
	පොල් කෙඳි සහ පොල් කෙඳි නිපැයුම් අපනයනකරුවෝ		1,395,800	-
	කොප්පරා බෙදාහරින්නන් ලියාපදිංචිය		57,000	-
	වෙන්දේසිකරුවන් සහ තැරැව්කරුවන් ලියාපදිංචිය		39,000	-
	දිසිදි පොල් මොල්කරුවන් ලියාපදිංචිය		1,101,505	-
	පොල් තෙල් මොල්කරුවන් ලියාපදිංචිය		1,872,168	-
	පොල් කෙඳි මෝල්කරුවන් ලියාපදිංචිය		280,500	-
	කොප්පරා නිපැයුම්කරුවන් ලියාපවිංචිය		130,500	-
	පොල්කටු අඟුරු නිපැයුම්කරුවන් ලියාපදිංචිය		165,836	-
	සැපයුම්කරුවන් ලියාපදිංචිය		338,164	-
	පොල් වතු හිමියන් ලියාපදිංචිය		127,600	-
	පොල් කිරි සැකසුම් ලියාපදිංචිය		826,000	-
	ඇක්ටිවේටඩ් කාබන් ලියාපදිංචිය		145,000	-
	පමාවී ලියාපදිංචි කිරීම් සඳහා අධිභාර		348,256	-
	විවිධ පොල් නිපැයුම් ලියාපදිංචිය		1,459,375	-
	නැවුම් පොල් ලියාපදිංචිය		8,950,000	-
	තැඹිළි ලියාපදිංචිය		620,000	
	NOLසහතික ගාස්තු		308,500	25,607,725

4	වෙන්දේසි ක්‍රියා පරිපාටිය			රු
	තොග ගාස්තු ආදායම -කොප්පරා සහ නැවුම් පොල්			1,397,167
	අඩු කළා :ශාලා ගාස්තු		(26,000)	
	වෙන්දේසි ගාස්තු		(660,533)	
	වෙනත්		(79,142)	(765,675)
				631,492
5	පරීක්ෂණාගාර ආදායම			රු
	තත්ව සහතික		1,666,927	
	දිසිදි පොල් ආදර්ශ සහ පරීක්ෂණ ගාස්තු - දිසිදි		8,996,305	
	පරීක්ෂණ ගාස්තු- පොල් කෙඳි නිපැයුම්		2,850,095	
	පරීක්ෂණ ගාස්තු- පොල් කිරි නිපැයුම්		356,432	
	පරීක්ෂණ ගාස්තු- පොල් තෙල්		2,004,883	
	ජල ආදර්ශ ගාස්තු		211,189	16,085,831
				16,085,831
6	විවිධ අදායම්			
	ජී බී ඕ			
	ටෙන්ඩර් තැන්පතු			
	පත්‍රිකා අලෙවිය		82,984	
	පුහුණු ආදායම		663,890	
	වාහන කුලී ගාස්තු		35,744	
	අපනයන ආපසු එවුම් මත ගාස්තු		368,204	
	සුළු ආදායම		742,016	
	එන් ආර් අයි අරමුදලට මාරු කිරීම්		188,197	
	ලේබල් පොත් සහ ස්ටිකර් ගාස්තු		2,258,392	4,339,426
7	දුන්කන්නාව මොඩර්න් මෝල			
	කොහු සහ කෙඳි අලෙවිය			
	අඩුකළා වියදම්			512,196
	වැටුප් සහ වේතන	881,075		
	සේ නි අ සහ සේ නි හා අර	274,112		
	රක්ෂන	5,468		
	දුරකථන ගාස්තු	22,295		
	විදුලිය	126,627		
	වෙනත් වියදම්	14,331	(1,323,908)	(1,323,908)
	දුන්කන්නාව පොල් මෝල			
	ගෙඩි පොල් අලෙවිය			2,936,344
	අඩු කළා වියදම්			
	වැටුප් සහ වේතන	1,181,449		
	සේ නි අ සහ සේ නි හා අර	367,562		
	පොල් කැඩීමේ සහ පොළොහ වියදම්	467,915		
	විදුලිය	7,741	(2,024,667)	(2,024,667)
				99,965
				රු
8	සැකසුම් සංවර්ධන වැඩසටහන්			27,307,750
9	අලෙවි සංවර්ධන සහ පර්යේෂණ වැඩසටහන්			9,436,712
10	තත්ව පාලන සහ තත්ව සහතික කිරීම්			415,736

2020.12.31.දිනට දිසිදි පොල් මොල්කරුවන්ට සපයන ලද සේවා

මෝල් අංකය		2018/2019	2020	2020	එකතුව
			දිසිදි පරීක්ෂාව	ජල ආදර්ශ	
		රු	රු	රු	රු
M 62	ඩෙසිකෝ ලංකා පුද් සමාගම, ගනේවත්ත මිල්ස්, නිකදළුපොත		72,500.00		72,500.00
M 64	රත්කරවිවි දිසිදි සහ තෙල් මෝල මාස්පොත	31,852.50	86,250.00	12,320.00	130,422.50
M 67	මාරවිල වි සේ ස ස මාරවිල		57,500.00		57,500.00
M 69	බටුවත්ත ඩී සී මිල්ස් පුද් සමාගම		142,500.00		142,500.00
M 71	මාදම්පේ මිල්ස් පුද් සමාගම තඹගල්ල කාක්කපල්ලිය	61,250.00			61,250.00
M 72	සෙන්ට් ජෝශප් ඩී සී මැනුෆැක්චරස් පුද් සමාගම කොළඹ පාර වටිනාපහ		40,000.00		40,000.00
M 75	සිරියාංගනී ඩිසි ඇන්ඩ් ෆයිබර් මිල්ස් ගිරිඋල්ල පාර කටාන		216,250.00	11,164.00	227,414.00
M 76	එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා පුද් සමාගම් ලෝලුවගොඩ මිල්ස් ලෝලුවගොඩ	16,250.00	35,000.00		51,250.00
M 77	සෙන්ට් ඇන්ස් ෆැක්ටරි, දලුව මාම්පුරිය	32,500.00	82,500.00		115,000.00
M 79	රේනුකා ඇග්‍රි ඕර්ගනික් පුද් සමාගම		60,000.00		60,000.00
M 80	දූනගහ වි සේ ස ස කෙහෙල් ඇල්ල මිල්ස් බඩල්ගම		10,000.00		10,000.00
M 84	පොත්තේවෙල ඩී සී ඇන්ඩ් ඔයිල් මිල්ස් මීරිගම පාර බාඳුරාගොඩ		55,000.00		55,000.00
M 85	විවි ප්ලාන්ටේෂන් පුද් සමාගම	15,000.00	96,250.00		111,250.00
M 86	පේ පී එම් පින්ටෝ සහ සමාගම නව පාර වෙන්නප්පුව		35,000.00		35,000.00
M 87	සෙන්ට් වැලන්ටයින් ඩී සී ෆැක්ටරි		12,500.00		12,500.00
M 88	සොනික් එක්ස්ෆෝ පුද් සමාගම	110,162.00	78,750.00		188,912.00
M 89	කුඩාවැව මිල්ස් කුඩා වැව	23,384.00	53,750.00		77,134.00
M 90	නැදුන්ගමුව මිල්ස් නැදුන්ගමුව		22,500.00		22,500.00
M 91	සඳලංකා ඩී සී මිල්ස්		111,250.00		111,250.00
M 93	ග්‍රීන් ෆාම් මිල්ස් කලුඅරිප්පුව කටාන	54,658.15	72,500.00		127,158.15
M 94	සිරිකත ඩී සී මිල්ස් කොච්චිකඩේ		33,750.00		33,750.00
M 95	සී බී එල් කොකොස් පුද් සමාගම කොළඹ පාර අලව්ව	37,500.00	56,250.00		93,750.00
M 98	සෙරන්ඩිබ් සුපර් ෆුඩ් පුද් සමාගම	18,414	152,500		170,914
M 102	එන් එම් කේ කොකෝ ලැන්ඩ් පුද් සමාගම	66,250			66,250
M 102	නාරා කොකෝ ලැන්ඩස්	5,435	-		5,435
M 103	සෙන්ට් තෙරේසා ඩී සී මිල්ස් කටාන		198,750		198,750
M 105	ඩී වයි ඇන්ඩ් ඩී යූ රාජපක්ෂ පුද් සමාගම හේනෙගම ඩී සී මිල්ස්		78,750		78,750
M 107	චන්ද්‍රා ඩී සී මිල්ස් කඳවල කටාන		16,250		16,250
M 110	රේනුකා ඇග්‍රි ඕර්ගනික් පුද් සමාගම උනගහදෙණිය		133,750		133,750
M 111	කුඩියිරිප්පු පොල් නිෂ්පාදන සමාගම		51,250		51,250
M 113	බැලුම්මහර ඩී සී මිල්ස් බැලුම්මහර, මුදුන්ගොඩ		110,000		110,000
M 114	නාත්තන්ඩිය මිලිස්	21,250	71,250		92,500

M 115	බෝගමුව ඩී සී මිල්ස්, අලුත්ගම බෝගමුව අලුත්ගම	8,474			8,474
M 119	මාතම්මන ඩී සී මිල්ස් මිනුවන්ගොඩ		96,250		96,250
M 120	ෆාතිමා ඩීසී ඇන්ඩ් ඔයිල් මිල්ස් නයිනමඩම		80,000		80,000
M 122	සෙන්ට් ජෝශප් ඩී සී ඇන්ඩ් ෆයිබර් මිල්ස් කටාන		65,000		65,000
M 126	ලක්ෂ්මී ඩී සී මිල්ස්, බටකන්ද බඩල්ගම	14,962	181,250		196,212
M130	බෝයගනේ ඩී සී මිල්ස් පුද් සමාගම, බෝයගනේ කුරුණෑගල	46,250	21,250	12,088	79,588
M 131	ජයකොඩි මිල්ස් පුද් සමාගම නාත්තණ්ඩිය පාර දන්කොටුව	14,503	26,250		40,753
M 132	ඒසියන් ඇග්‍රෝ ප්‍රොඩක්ට්ස් පුද් සමාගම	6,250	88,750	11,214	106,214
M 133	උපාලි ඩී සී මිල්ස් තලවිල මාරවිල	6,250			6,250
M 134	ගුනවර්ධන ඩී සී මිල්ස් ගලවත්ත කටාන	4,254	42,500		46,754
M 136	වෙල්වින් ඩී සී මිල්ස් මිනුවන්ගොඩ	38,600	31,250		69,850
M 139	සංහිඳ ඩී සී මිල්ස් පුද් සමාගම		55,000		55,000
M 144	ස්වානී ඩී සී මිල්ස් මිගමුව		80,000		80,000
M 145	දූනගහ වී සේ ස ස දූනගහ	5,000	23,750		28,750
M 148	ආර් එම් පී කොකනට් ප්‍රොඩක්ට්ස්, පුද් සමාගම			11,146	11,146
M 149	මාවික්සෙල් ඉන්ටර්නැෂනල් පුද් සමාගම		203,750	13,560	217,310
M 150	එන් ඩී සී එක්ස්පොර්ට් පුද් සමාගම		21,250		21,250
M 151	වයඔ ඩී සී ඇන්ඩ් ඔයිල් මිල්ස් පුද් ගමාගම		62,500		62,500
M 152	සන්මික් ෆුඩ්ස් පුද් සමාගම	17,240	75,000		92,240
M 153	නාවික් මිල්ස් පුද් සමාගම		65,000		65,000
M 156	වී එස් එස් ප්‍රොඩක්ට්ස් පුද් සමාගම		11,250		11,250
		655,689	3,472,500	71,492	4,199,681

2020.12.31. දිනට ණයගැතියෝ-නැවුම් පොල් සහ කොප්පරා තොග ගාස්තු සහ පොල් කිරි නිපැයුම්

කොප්පරා	ප්‍රමාණය රු.
කොප්පරා තොග ගාස්තු	
සී ඇන්ඩ් ජේ මැතිව් සහ පුද් සමාගම	39,919
එල් එස් ටී ඩී එස් විජේරත්න සහ සමාගම	8,995
නැවුම් පොල් වෙන්දේසි ගාස්තු	
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	182,958
හලාවත වැවැලි සමාගම	12,377
පොල් පර්යේෂණ ආයතනය	10,878
පොල් වගා කිරීමේ මණ්ඩලය	113,694
පී පී ගුණසේකර මිය	(3,612)
ලාලන් රබර් පුද් සමාගම	39,542
කුරුණෑගල වැවිලි සමාගම	47,558
ඇල්කඩුව වැවිලි සමාගම	111,989
එච් එල් ඩී මෙල් සහ පුද් සමාගම	46,748
සී දීපාල් මැතිව් මහතා	1,398
පොල්කනත්තෙ වත්ත	252
දික්ලන්ද වතුයාය	2,340
වයිග්‍රෝ පුද් සමාගම	289
මැදගම්පොල වතුයාය	389
දෙල්හේන වතුයාය	778
එකතුව	616,490
වැඩිපුර ගෙවූ තොග ගාස්තු	
ආර් එම් මෙල්	(2,652)
ගනේ කන්ද වතුයාය(ජනවසම)	(102)
මිල්ලෙවාන වතුයාය	(9,961)
රාගෙදර පතල් සමාගම	(1,209)
මාර්සන්දවිල වතුයාය	(218)
රාද්දෙගොඩ වතුයාය	(800)
එකතුව	(14,942)

පොල් කිරි නිපැයුම්	
නම	ප්‍රමාණය (රු)
බයෝ ෆුඩ්ස් පුද් සමාගම	-
සී බී එල් ග්ලෝබල් ෆුඩ් ලිමිටඩ්	6,000
කොන්සොලිඩේටඩ් බිස්නස් සිස්ටම්ස්	18,000
ජායින්දි එක්ස්පෝර්ට් පුද් සමාගම	6,000
කන්දෙකැටිය ඇග්‍රෝ ප්‍රොඩක්ට්ස්	6,000
මන්වි ඩී කොකෝ ප්‍රොඩක්ට්ස්	18,000
මාස් ට්‍රොපිකල් ෆුඩ් ප්‍රොසෙසින් පුද් සමාගම	18,000
නාරා කොකෝ ලැන්ඩ් පුද් සමාගම	18,000
එන් ඩී සී එක්ස්පෝර්ට්ස පුද් සමාගම	18,000
නෙක්ස්පෝ කන්වර්ෂන් පුද් සමාගම	6,000
රේනුකා ඇග්‍රි ෆුඩ් පීඑල් සී	18,000
සිල්වර් මිල් නැවුරල් බෙවරේජස්	6,573
සන්මික් ෆුඩ්ස් පුද් සමාගම	18,000
වගුරුවෙල ඔයිල් මිල්ස්	6,000
විවී වැවිලි සමාගම	573
	163,145

පොල් සංවර්ධන අධිකාරිය
පුනරාවර්තන වියදම්

2,019	2020 ඇස්තමේන්තුව	විස්තරය	උප එකතුව	2,020
				එකතුව
රු.		පුද්ගල පාරිශ්‍රමික		රු
81,245,300	87,000,000	වැටුප් සහ වේතන	84,192,276	
16,682,830	21,240,000	සේ අ අ, සේ භා නි ර	18,343,954	
18,714,418	19,200,000	ජීවන වියදම් සහ අනෙක් දීමනා	18,172,889	
406,748	500,000	නිවාඩු දින වැටුප්	188,367	
1,210,000		ගැලපුම් දීමනා	-	
1,389,013	4,000,000	ඉන්ධන දීමනා	646,408	
1,090,222	7,000,000	විශේෂ දීමනා	1,334,698	
8,129,428	6,000,000	අතිකාල	7,376,178	
3,885,330	4,500,000	සුභසාධන වියදම්	2,025,820	-
1,593,063	2,000,000	පුහුණු සහ සම්මන්ත්‍රණ	353,141	
5,980,366	6,000,000	වෛද්‍ය රක්ෂණ	4,921,861	
140,326,718				137,555,593
		ගමන් වියදම්		
3,118,731	6,000,000	ගමන් වියදම් දේශීය	3,124,211	
390,400		වාහන ගාල් කිරීමේ ගාස්තු	288,000	
3,509,131				3,412,211
		සැපයුම් සහ අවශ්‍යතා		
8,529,999	6,000,000	පිලිද්‍රව්‍ය සහ අනෙක් අවශ්‍යතා	7,082,726	
		ලේබල් පොත් සහ ස්ටිකර් මුද්‍රණ		
		මාසික පුවත් මුද්‍රණ		
4,326,818	8,924,000	ඉන්ධන සහ ලිහිසි තෙල්	4,396,084	
434,986	900,000	නිල ඇඳුම්	537,870	
10,384,779	7,250,000	විද්‍යාගාර රසායන ද්‍රව්‍ය සහ අනෙක් පාරිභෝගික අයිතම	13,927,699	
		විදුරු බඩු	-	
2,081,312		අනෙක් අවශ්‍යතා	1,593,323	
		සාමාජික මුදල් (දායක මුදල්)	-	
25,757,894				27,537,702
		අලුත්වැඩියා සහ නඩත්තු		
2,539,470	3,000,000	ව්‍යුහ සහ ගොඩනැගිලි	2,987,871	
		ඩියුක් වීදිය	1,375,749	
3,014,270	3,000,000	යන්ත්‍ර කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ	2,429,599	
6,173,902	5,000,000	වාහන	5,339,481	
11,727,642				12,132,699
		ප්‍රවාහන, සන්නිවේදන, පහසුකම් සහ අනෙක් සේවා		
3,465,015	5,100,000	සන්නිවේදන	2,530,591	
2,006,592	2,500,000	ප්‍රවාහන	1,209,382	

2,474,575	3,600,000	අආරක්ෂක සේවා	3,718,960	
3,220,629	3,650,000	පවිත්‍රතා සේවා	2,919,946	
8,038,992	8,760,000	වාහන කල්බදු කුලී	8,711,062	
6,409,029	5,200,000	විදුලිය	4,727,531	
	800,000	ජලය	547,531	
1,570,329	2,000,000	වරිපනම් සහ බදු	1,340,138	
112,212	600,000	නෛතික ගාස්තු	-	
337,440	300,000	තැපැල් ගාස්තු සහ මුද්දර ගාස්තු	245,876	
600,000	900,000	විගණන වියදම්	500,000	
52,990	66,000	බැංකු ගාස්තු	33,196	
28,287,802				26,484,212
		බදු සහ අනෙකුත් අයකිරීම්		
1,027,977		ආර්ථික සේවා ගාස්තු	966,454	
2,140,099		වටිනාකම් එකතු කළ බදු	411,212	
-		මුද්දර ගාස්තු	6,625	
3,168,076				1,384,290
		වෙනත්		
	3,250,000	රක්ෂණ	710,179	
456,623	100,000	සභාපතිගේ සංග්‍රහ වියදම්	100,000	
1,432,291	2,050,000	මණ්ඩල සාමාජික දීමනා සහ මණ්ඩල රැස්වීම් සඳහා වියදම්	852,671	
1,275,445	400,000	අලෙවි ප්‍රවර්ධන	2,655,331	
		කෝවිඩ් වැලැක්වීමේ වියදම්	560,848	
3,164,359		වෙනත් වියදම්	20,001	4,899,029
215,941,622	236,790,000	මුළු වියදම්		213,405,737

06. අභ්‍යන්තර විගණන අංශය

2020 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම, අධිකාරියේ ක්‍රියාකාරී අංශ වන සැකසුම් සංවර්ධන අංශය, අලෙවි සංවර්ධන හා ආර්ථික පර්යේෂණ අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයන්හි ක්‍රියාකාරී සැලැස්ම ආවරණය වන පරිදි සහ ඊට අමතරව පරිපාලන අංශය සහ මුදල් අංශ වල කටයුතු ආවරණය වන ආකාරයට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ විගණන හා කළමනාකරණ කමිටු සභාපතිගේ උපදෙස් පරිදි සකස් කර ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව, අනුමත කල විගණන සැලැස්ම පරිදි විගණන පරීක්ෂාවන් සිදුකර වාර්තාවන් 12 ක් ඉදිරිපත් කරන ලදි. කළමනාකාරිත්වය විසින් පවරන ලද විශේෂ විමර්ශනයක් වර්ෂය තුල සිදුකරන ලද අතර, මෙම විමර්ශණයට අදාල වාර්තාව වර්ෂය තුල සිදුකර කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කර ඇත.

6.1 විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

6.1.1 සංයුතිය සහ ගණපූර්ණය

රාජ්‍ය ආයතනවල යහපාලනයට අදාල මාර්ගෝපදේශ අත්පොත නමින් වූ 2003.06.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 4.7.1 දරණ පරිච්ඡේදය සහ 2010.12.04 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/55 ප්‍රකාරව පොල් සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා, එම චක්‍රලේඛ විධිවිධාන අනුව එම කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම සිදුකෙරේ. විගණන හා කළමනාකරණ කමිටු මණ්ඩලය විධායක නොවන සමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.සමාලෝචනයට බඳුන්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වන ලද අතර කමිටුව පහත නම් සඳහන් මහත්ම මහත්මීන්ගෙන් සමන්විත විය.

2020.06.02 දින පැවති 2020/01 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

1. එන්.එස් වනසිංහ මයා (අමාත්‍යාංශ නියෝජිත) - කමිටු සභාපති
2. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය(භාණ්ඩාගාර නියෝජිත) - කමිටු සාමාජික
3. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා - කමිටු සාමාජික
4. උපාලි ධම්මික ද සිල්වා මයා - කමිටු සාමාජික

2020.08.26 දින පැවති 2020/02 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

5. එන්.එස් වනසිංහ මයා (අමාත්‍යාංශ නියෝජිත) - කමිටු සභාපති
6. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය(භාණ්ඩාගාර නියෝජිත) - කමිටු සාමාජික
7. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා - කමිටු සාමාජික
8. උපාලි ධම්මික ද සිල්වා මයා - කමිටු සාමාජික

2020.10.26 දින පැවති 2020/03 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම (Zoom තාක්ෂණය ඔස්සේ) පවත්වන ලදී.

1. එන්.එස් වනසිංහ මයා (අමාත්‍යාංශ නියෝජිත) - කමිටු සභාපති
2. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය(භාණ්ඩාගාර නියෝජිත) - කමිටු සාමාජික
3. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා - කමිටු සාමාජික
4. උපාලි ධම්මික ද සිල්වා මයා - කමිටු සාමාජික

2020.12.10 දින පැවති 2020/04 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

1. එන්.එස් වනසිංහ මයා (අමාත්‍යාංශ නියෝජිත) -කමිටු සභාපති
2. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය(භාණ්ඩාගාර නියෝජිත) - කමිටු සාමාජික
3. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා - කමිටු සාමාජික
4. උපාලි ධම්මික ද සිල්වා මයා - කමිටු සාමාජික

විගණකාධිපතිවරයාගේ නියෝජිත 2020 වර්ෂයේ පවත්වන ලද සියළුම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගි වී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සියළුම රැස්වීම් සඳහා සහභාගී වී ඇත. කමිටුවෙහි, කළමනාකරණය නියෝජනය කරන සාමාජිකයින් කිසිවෙකු නොමැත. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආරාධනයෙන් රැස්වීම සඳහා සහභාගි වේ. කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයින්ගේ සහභාගිත්වය කමිටුවට අවශ්‍ය වූ විට, රැස්වීම සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලබයි. කමිටුවෙහි ගණපූර්ණය සාමාජිකයින් 03 කි.

6.2 කමිටුවෙහි කාර්යය භාරය

- පූර්ව අවසාන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය කරමින් කමිටු උපදෙස් සහ නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිළිබඳ විමසා බැලීම.
- ආකෘති සහ අන්තර්ගතය සමාලෝචනය කිරීම සහ පොල් සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රමයෙහි විශ්වසනීයත්වය අධීක්ෂණයට ලක් කිරීම.
- බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයෙහි විෂය මුලිකත්වය හා සඵලදායකත්වය සහතික කිරීම සඳහා යොදා ඇති ක්‍රියා මාර්ග නියාමනය හා සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි යෝග්‍යතාවය සහ සාර්ථකත්වය සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන විමසුම් හා ඒ සඳහා ගන්නා ලද පියවර සමාලෝචනය කිරීම.
- නියාමන සහ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමඟ අනුගත වීම සහ අදාළ නියාමන අධිකාරීන් සමඟ පවත්නා සම්බන්ධතා සහතික කිරීම සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිතීන් හා ක්‍රියාපරිපාටීන් පිළිබඳ සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

6.3 රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුල හතරවරක් (04) කමිටුව හමුවන ලදී. රැස්වීම සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

කමිටුව	සහභාගී වූ රැස්වීම් ගණන
එන්.එස් වනසිංහ මයා (කමිටු සභාපති)	04
අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය	04
ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා	04
උපාලි ධම්මික ද සිල්වා මයා	04

වගුව 31 : සමාලෝචිත වර්ෂය කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී.

6.3.1 අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු වලට අදාලව 2020 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සැලකිල්ලට ගනිමින් පිළියෙල කරනු ලැබූ අභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම සාකච්ඡාවට භාජනය කර, වැඩිදුරටත් විගණනයට භාජනය කලයුතු ක්ෂේත්‍රයන් පිළිබඳ උපදෙස් දීම සහ විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම මණ්ඩලීය අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.
- 2020 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි සඵලදායකත්වය අධීක්ෂණයට ලක් කරන ලදී.
- අභ්‍යන්තර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ ප්‍රගතිය ඇගයීම.
- අනාගතයේදී නැවත සිදුවීම් වලක්වනු පිණිස කාලීන නිරවද්‍ය පියවරයන් ගැනීමේ අරමුණින් යුතුව විශේෂ අභ්‍යන්තර විගණන සොයාගැනීම් හා ඒවා සඳහා කළමණාකරණයේ ප්‍රතිචාර සමාලෝචනයට ලක් කරන ලදී.

6.3.2 බාහිර විගණනය

- 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලට අදාලව පිළිතුරු යැවීමේ ප්‍රගතිය ඇගයීම සහ කළමනාකරණය විසින් දක්වන ලද පිළිතුරු සමාලෝචනයට ලක් කරන ලද අතර, විශේෂයෙන් පෙන්වාදෙන ලද ගැටළු නැවත ඇති වීම වළක්වනු පිණිස කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කරන ලදී. 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 2018 අංක 19 දරණ විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර වාර්තාව මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ කමිටුව විසින් අවධානය යොමුකල අතර, එම කරුණු වලට අදාලව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරම් සිදුකර ඇත.

6.3.3 මූල්‍ය වාර්තාකරණය

- වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණ හා නියාමන අධිකාරිය විසින් නියම කරන ලද අවශ්‍යතාවයන්ට හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කිරීමේදී මණ්ඩලයට සහයවන ලදී.

6.3.4 රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම්

- කමිටු පැවැත්වීම පිළිබඳ යෝග්‍ය රැස්වීම් වාර්තා මණ්ඩලීය ලේකම් කාර්යාලයෙහි පවත්වාගෙන යනු ලැබේ. රැස්වීම්වල සියළුම වාර්තා සභාගත කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සම්මත කර ගන්නා ලදුව කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබා ගනු ලැබේ. ක්‍රමික පදනමක් මත කැපී පෙනෙන කරුණු සම්බන්ධයෙන් පසු පියවරයන් ගනු ලැබේ. අධිකාරියෙහි අනුගත රාමුවට සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ගන්නා ලද නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ පියවරයන් සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PLA/DCDA/01/20/19 ඔබේ අංකය உமது இல. Your No.

දිනය

පොල් සංවර්ධන අධිකාරිය
21 OCT 2021
පාලන අංශය

2021 ඔක්තෝබර් 14 දින

සභාපති

පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

පොල් සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්පීත්වයන් විසින් අයවැයගත සංඛ්‍යා සහ තත්‍යසංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කළ හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල එසේ අයවැයගත සංඛ්‍යා ඇතුළත් කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ த்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු. 1,337,550 ක් වූ යන්ත්‍රෝපකරණ 65 ක් භාවිතයට ගනිමින් පැවතියද එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව නැවත සංශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයට අයත් දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ රු.1,008,348 ක වියදමකින් 2019 වර්ෂයේ සවිකරන ලද පෙට්ටිකුට්ටම් යන්ත්‍රය ඇතුළු යන්ත්‍රෝපකරණ සහ පරිගණක හා ලී බඩු උපකරණ ප්‍රාග්ධනිත නොකර ඒ ඒ වර්ෂයේ පුනරාවර්තන වියදම් වශයෙන් ලියාහැර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණවල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරුණි.

(ඈ) වසර 35 ක කාලයක සිට බී.සී.සී. ලංකා සමාගමෙන් ලැබිය යුතු රු.26,715,037 ක ණය ශේෂයක් සඳහා වාර්ෂිකව රු.4,011,609 ක් බැගින් පොලී ආදායමක් ගණනය කර එය ලබා ගැනීමේ සම්භාවිතාවයක් නොවීම නිසාඑම වටිනාකම අඩමාණ ණය ලෙසද වෙන් කර තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණ කිරීමටත්, ණය ශේෂය සඳහා වන හානිකරණ අගය වෙනුවෙන් අවශ්‍ය ගැලපීම් කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් 2005 හා 2006 වර්ෂයන්වලදී මිලදී ගෙන සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.3,363,900 ක් වූ යන්ත්‍රෝපකරණ 39 ක් නියමු ව්‍යාපෘතීන් සඳහා ලබා දී තිබූ බවට විගණනය වෙත කරුණු ඉදිරිපත් කරනු ලැබුවද, අදාල ව්‍යාපෘතීන්වල විස්තර නොවීම නිසා එම වත්කම්වල භෞතික පැවැත්ම පිළිබඳව සනාථ කර ගත නොහැකි විය. එසේම එම වත්කම් සමීක්ෂණය කර සුදුසු පරිදි අපහරණයට හෝ ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරද නොතිබුණි.

(ඊ) 2020 දෙසැම්බර් 31 දිනට භෞතික තොග සත්‍යාපනයක් සිදු කර තිබූ නමුත්එම භෞතික තොග අගය වෙනුවට තොග පොත් අනුවතිබුණු ශේෂය වූ රු. 26,351,915 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර් තිබුණි. පොත් අනුව ශේෂය භෞතික සත්‍යාපන වාර්තාව සමඟ නියැදි පරීක්ෂාවේදී රසායනාගාර උපකරණ තොගයන්හි රු.852,754 ක් වටිනා තොග ඒකක 101 ක ඌනතාවයක් ද,රු. 375,412 ක් වටිනා ඒකක 49 ක අතිරික්තයක් ද පැවතීමත්,තොග පොතට ඇතුළත් කර නොතිබූ වටිනාකම ගණනය නොකළ තොග ඒකක1834 ක් පැවතීමත් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්තොගයේ නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඇ) "දිසිදි" පොල් මෝල් හිමියන්ට සපයන සේවා සඳහා නිසි පරිදි ඉන්වොයිස් නිකුත් කර නොතිබීම, ණයගැති ලෙජරයක් පවත්වා නොතිබීම, මුදල්අයකර ගැනීමේ හා බැංකුවට සෘජුව බැර කරන මුදල් හඳුනා ගැනීමේ නිසි ක්‍රමවේදයන් නොතිබීම යනාදී කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු බවට ගිණුම්ගත කර තිබුණු රු.4,199,681 ක ණයගැතියන් හා ඊට අදාළව සමාලෝචිත වර්ෂය තුළ හඳුනාගෙන තිබුණු රු.8,996,305 ක ආදායමෙහි නිවැරදිකාවය තහවුරු කරගත නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කොට ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 පොල් සංවර්ධන අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් පොල් සංවර්ධන අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහවංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පොල් සංවර්ධන අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පොල් සංවර්ධන අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මකසාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිතවි ගණන පරිපාටි

සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පොල්පොල් සංවර්ධන අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යටතේ දක්වා ඇති නිරීක්ෂණවලව යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2(අ) හා (ඉ) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරියසම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2016 – 2019 අතර කාලයෙහි සමාන්‍ය වාර්ෂික පොල් තෙල් නිෂ්පාදනය වූ මෙ.ටො. 29,287 කින් මෙ.ටො. 5,516 ක් අපනයනය කිරීමෙන් පසු දේශීය පාරිභෝජනය සඳහා ඉතිරිවන සාමාන්‍ය පොල් තෙල් ප්‍රමාණය මෙ.ටො. 23,771

ක් පමණක් වුවද, දේශීය අවශ්‍යතාවය මෙ.ටො. 93,103 ක් වූයෙන් හිඟය වූ මෙ.ටො. 69,332 කින් මෙ.ටො. 5,044 ක් ආනයනික පොල් තෙල් මඟින්ද, ඉතිරි සියයට 69 ආනයනික ෆාම් ඔයිල් මඟින්ද සපයා ගනු ලබන අතර පසුගිය වර්ෂ 04 ක කාලය තුළ සාමාන්‍ය ෆාම් ඔයිල් ආනයනය මෙ.ටො. 199,433 ක් විය. ඒ අනුව ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් නිෂ්පාදනය වැඩි කිරීමට කටයුතු නොකර දේශීය පොල් තෙල් පරිභෝජන අවශ්‍යතාවයෙන් වැඩි කොටසක් ෆාම් ඔයිල් හා ආනයනික පොල් තෙල්වලින් සපුරා ගැනීම අධිකාරියේ අරමුණුවලට අනුරූප නොවන බව නිරීක්ෂණය විය.

(ආ) 1975 අංක 24 දරන පනතින් සංශෝධිත 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 51 වගන්තිය යටතේ පලකර තිබුණු 1979 දෙසැම්බර් 31 දිනැති අංක 69/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළමු වන උපලේඛනයේ ඇතුළත් 3 වන ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මක ප්‍රමිති නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය කළ යුතු වුවත් ශ්‍රී ලංකාවේ සමස්ත පොල් තෙල් පරිභෝජනයෙන් සියයට 72 ක් සඳහා ප්‍රමිත පරීක්ෂාවක් සිදු වී නොතිබූ බවට නිරීක්ෂණය විය. එසේම ගුණාත්මක පොල් තෙල් නිෂ්පාදනය සඳහා වන තරු 5 කින් යුත් ලාංඡනය 2019 වර්ෂයේදී ලබාගෙන තිබූ පොල් තෙල් මෝල් සංඛ්‍යාව 7 ක් පමණක් විය.

(ඇ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත ප්‍රකාරව "දිසිදි" පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා, අපනයනය කරනු ලබන සෑම දිසිදි පොල් කි. ග්‍රෑ 1 ක් වෙනුවෙන් ශත 20 ක් බැගින් සෙස් අරමුදලින් ලැබෙන මුදල් ඒ ඒ මෝල් හිමියන් නමින් ඉතිරි කිරීමේ බැංකු ගිණුම්වල තැන්පත් කොට මෝල් සංවර්ධනය කිරීමේ අරමුණින් 1980 වර්ෂයේදී පිහිටුවා තිබූ මෝල් සංවර්ධන අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු කාර්යයක් සිදු කර නොතිබූ අතර කර්මාන්ත නහා සිටුවීමේ සැලසුම්ගත වැඩ පිළිවෙලක් ද සකස් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී සෙස් අරමුදල් ලැබුණු රු.5,916,064 ක් ඇතුළුව වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.84,206,686 ක් ද, බැංකු තැන්පතුවල වටිනාකමරු.160,835,956 ක්ද විය.

(ඇ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ බලතල අනුව පොල් තෙල් විශාල තොග වශයෙන් මිලදී ගෙන මිල අඩු වැඩි වීම අනුව වෙළඳපොලට නිකුත් කිරීම මඟින් මිල පාලනය කිරීමේ අරමුණින් පොල්තෙල් මිල ස්ථායිකරණ අරමුදල පිහිටුවා තිබුණද, 1981 වර්ෂයේ සිට මෙම වැඩ පිළිවෙල අධිකාරිය විසින් අතහැර දමා ඒ සඳහා වරායේ පවත්වා තිබූ තෙල් ටැංකි ද වෙනත් ආයතනවලට ලබා දී තිබුණි. එසේ වුවද, 1985 වර්ෂයේ සිට හිඟහිට ඇති රු.78,865,954 කණය මුදලක් ඇතුළුව එකතුව රු.157,943,367 ක අයවිය යුතු ණය ශේෂයක් ද, රු.220,171,884 ක ආයෝජන ශේෂයක් හා රු.324,046,799 ක සමුච්චිත අරමුදල් ශේෂයක් ද සහිතව සමාලෝචිත වර්ෂය දක්වාම අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පැවතුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ හැර** අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

කොහු කර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ පාර්ශවයන් පුහුණු කිරීමේ අරමුණින් 2006 වර්ෂයේදී ආරම්භ කර තිබූ දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු, සේවක හිඟය හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් 2020 පෙබරවාරි මස සිට නතර කොට දමා තිබුණි. මේ හේතුවෙන් 2019 හා 2020 වර්ෂයන්හි රු.1,586,383 ක වියදමකින් මිලදී ගත් ප්‍රාග්ධන වත්කම් ඇතුලුව යන්ත්‍රෝපකරණ, පොල් ලෙලි පුරවන ලද මට්ටා වලවල්, ගොඩනැඟිලි හා ලී බඩු උපකරණ නිෂ්කාර්යව විනාශවීමේ අවධානමකින් යුතුව පැවතුණි.

2.3 වෙනත් කරුණු

(අ) බ්‍රිටිෂ් සිලෝන් කම්පනි ලංකා සමාගමට (B.C.C.) 1985 වර්ෂයේදී පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලෙන් ලබා දී තිබූ පොලී සහිත ණය රු.26,715,037 ක් හා 2002 හා 2004 වර්ෂයන්හිදී ප්‍රාග්ධන සංවර්ධන අරමුදලින් ලබා දී තිබූ පොලී රහිත ණය රු.31,550,000 ක් වශයෙන් එකතුව රු.58,265,037 ක ණය මුදල රු. 52,150,917 ක පොලිය සමඟ අය කර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ සිට ගලවා ඉවත් කර ඇති ජලයේ බැර ලෝහ පරීක්ෂා කිරීම් සඳහා යොදා ගන්නා රු.4,984,973 ක් වටිනා Atomic Absorption Spectrophotometer (AAS) උපකරණය 2021 ජූලි මාසය අවසාන වන විටත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු බැවින් අදාළ සේවාවන් සැපයීමට හා ආදායම් උපයා ගැනීමට නොහැකි වී තිබුණි. එම උපකරණය දෝෂ සහිත බවට වාර්ෂික තොග සමීක්ෂණ වාර්තාවෙහි කිසිදු සඳහනක් නොවීය.

(ඇ) ජය ඉසුර ණය ලබාදීම සඳහා 2015 හා 2020 වර්ෂ අතර කාලයේදී මොල් සංවර්ධන අරමුදල සඳහා පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදලෙන් රු.76,277,972 ක් ද,රජයෙන් රු.123,000,000 ක් ද වශයෙන් ලබාගෙන තිබූ එකතුව රු.199,277,972 ක ණය මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති